ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව

# සටහන

31 වෙළුම 1-2 කලාපය 2012 ජනවාරි - පෙබරවාරි




# රන් සම පාඩමක්!

ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා ද්විමාසිකය

# රන් සම පාඩමක්!

මිල මැනීමේ උපකරණයක් වශයෙන් රන්වලට ඇත්තේ ඉතා දිගු ඉතිහාසයකි. මුදල් ක්‍රමය ආරම්භයේ දී ම රන්වලට ඒ කාර්යය පැවරිණි. එයට මූලික වශයෙන් ම හේතු වූයේ රන්වල දුලබ බවත් එහි වටිනාකම පිළිබඳ ව පොදුවේ පවත්නා පිළිගැනීමත් ය. එහෙත් වෙළෙඳපොළ ව්‍යාප්ත වත් ම රන් වැනි වටිනා ලෝහ මුදල් වශයෙන් සෘජුව භාවිතයට ගැනීම ගැටලු ඇති කරන්නක් විය. ඒ දුෂ්කරතා මග හරවාගැනීමට යෙදූ පිළියම් පරිසමාප්තියට පත්වූයේ ආඥාප්ති මුදල් භාවිතයට එක්වීමෙනි. එහෙත් ඒ විසඳුම ද ගැටලුවක් බවට පත්වූයේ ආඥාප්ති මුදලෙහි වටිනාකම තීරණය කිරීමේ දී ය. ඒ අනුව, රන් සම්මතය භාවිතයට ආවේ ය. බ්‍රෙටින්වුඩ්ස් එකඟතාව විසින් එහි කූඨප්‍රාප්තිය සනිටුහන් කෙරිණි.

එක්සත් ජනපද ඩොලරයක වටිනාකම රන් ග්‍රෑම් 0.888671 කට සම කරනු ලැබී ය. අනෙක් ව්‍යවහාර මුදල් ඩොලරය හා ගැට ගැසිණි. මෙ ලෙසින් ඇති කරගත් බ්‍රෙටින්වුඩ්ස් එකඟතාව රැකගැනීම විසිවන සියවසේ දෙවන භාගයෙන් අඩක් තුළ ලෝක ආර්ථිකය කැළඹූ වූ මහා සටනක් බවට පත් විය. මෙ වර “සටහන” ඒ සටනේ එක් අදියරක් ගැන විස්තරාත්මක ව සාකච්ඡා කරයි. ආර්ථික ඉතිහාසයේ රන් අකුරින් නො ලියැවුණ ද ඒ ආර්ථික විද්‍යාවේ මූලධර්ම මේ යැයි මැනැවින් පහදා දුන් කදිම පාඩමක් වෙයි. එ හෙයින් ඒ පාඩම කෙරෙහි අපේ පාඨකයන් ගේ අවධානය යොමු කිරීම අතිශයින් වැදගත් බව අපි විශ්වාස කරමු.

වෙළෙඳපොළේ සෑම භාණ්ඩයක ම මිල ඉහළ යන වාතාවරණයක් තුළ රන් ග්‍රෑම් 0.888671 ක මිල ඩොලර් එකකට සීමා කළ හැකි ද? රන් සඳහා වන ඉල්ලුම නීතියෙන් වැළැක්විය හැකි ද? එ සේ වැළැක්විය හැකි නම් එහි අර්ථය කුමක් ද? ආර්ථික ජයග්‍රහණයේ රන් කුසලානය මිනිසාට අහිමි බව ද? සියලු පෙරමුණුවල ජය කෙහෙළි නැංවූ මිනිසාට රන් පරිභෝජනයට අයිතියක් නැති ද?

මේ ආකාරයේ දහසක් ප්‍රශ්න උපදවන යුගයක් පසු කර යෑමට මිනිසාට සිදු විය. ලෝකයේ සෑම අතෙකින් ම ඉහළට නැඟ ගත් ඇමෙරිකා එක්සත් ජනපදය රන් ළඟ තබාගැනීම සඳහා තම පුරවැසියන්ට තිබූ අයිතිය උදුරා ගත්තේ ය. රන් මිල දමනය කර තැබීම සඳහා අනවරත වූ උත්සාහයක යෙදී සිටියේ ය. එහෙත් ඒ නියත පරාජයක් දැක දැක කළ සටනක් විය. එය හැඳින්විය හැක්කේ ජාතීන් සමූහයක් එක් ව දියත් කළ මහා යුද්ධයක් වශයෙනි.

එය ඇත්තෙන් ම ලෝක යුද්ධයකි. ජාතීන් එක් ව සටන් වැද සිටියේ රන් මිලට එරෙහි ව ය. ලන්ඩන් රන් හවුල පිහිටුවා ගැනීමෙන් ලොව ධනවත්, බලවත් ජාතීහු රන් මිලට එරෙහි ව කඳවුරු බැඳගත්හ. රන් සැපයුමේ අපරිමිත බව පිළිබඳ මායාවකින් සියලු ජනයා රැවටීමට ඔවුහු උත්සාහ කළහ. රන්වල නිසඟ වටිනාකම ගැබ් ව ඇත්තේ ම එම ලෝහයේ හිඟකම තුළ ය. මුදල් වශයෙන් රන් භාවිතා කිරීම මිනිසා ඇරඹූවේ ම ඒ හේතුවෙනි. කාලයත් සමඟ ආඥාප්ති මුදල් ඉදිරියට ආ විට ද එයට පිටුබලයක් වශයෙන් රන් සම්මතයක පිහිට පැතීමට මිනිසා යොමු වූයේ ද ඒ හේතුවෙනි. එ බැවින් රන් යනු හිඟ සම්පතක් බව ආර්ථික විද්‍යාව පිළිබඳ මළ පොතේ අකුරක් හො නො දැන සිටි අය පවා දැන සිටියහ. සක් සුදක් සේ පැහැදිළි ඒ ඇත්ත කඩතුරාවකින් වසා දැමීම කිසි ලෙසකින් හෝ කළ නො හැක්කක් විය. රන් හවුලට එරෙහි ව රන් වෙළෙඳපොළ නැගී සිටියේ ය. සියලු බලපුළුවන්කාරකම් තිබිය දී රන් හවුල බිඳ වැටුණේ ය. වෙළෙඳපොළ විසින් ආර්ථික ආඥාදායකත්වයක් අවසන් කර දැමිණි. කිසිදා අමතක කළ නො හැකි පාඩමක් මිනිස් ඉතිහාසය තුළට එක් කෙරිණි.

අපි ඉතිහාසයෙන් ඉගෙන ගනිමු!


සටහන ISSN 1391-3697

2012 ජනවාරි/ පෙබරවාරි

පිටපතක මිල : රු. 10.00

වාර්ෂික දායකත්වය : රු. 240.00 (තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

සන්නිවේදන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් පහත සඳහන් ලිපිනයට එවීමෙන් “සටහන” තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ



| ලිපි යොමුව | පිටුව |
|---|---|
| ලන්ඩන් රන් හවුල | 3 |
| විදේශ විනිමය අනුපාතිකයේ හැසිරීම | 9 |
| විනිමය බිල්පතේ උපත | 15 |



“සටහන” සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# නො කෙරෙන වෙදකමට එක් කළ

# ලන්ඩන් රන් හවුල

**වරුණ චන්ද්‍රකීර්ති**

සන්නිවේදන දෙපාර්තමේන්තුව

රන්, රිදී, ප්ලැටිනම් වැනි වටිනා ලෝහ ද්‍රව්‍ය මැනීම සඳහා සම්මත මිනුම වශයෙන් යොදාගනු ලබන්නේ ට්‍රෝයි (Troy) අවුන්සය යි. වර්තමානයේ මිනුම් අනුව ගත් කල ට්‍රෝයි අවුන්සයක් යනු ග්‍රෑම් 31.1034768 කි. ඇමෙරිකා එක්සත් ජනපදය 1834 වසරේ දී රන් ට්‍රෝයි අවුන්සයක මිල ඩොලර් 20.67 ක් බව ප්‍රකාශයට පත් කළේ ය. එතැන් සිට 1934 වසර දක්වා ම රත්රන් ට්‍රෝයි අවුන්සයක මිල එම අගයෙහි සිර කොට තිබිණි.



ෆ්‍රෑන්ක්ලින් ඩී. රූස්වෙල්ට්

1933 අප්‍රේල් 5 දා, ෆ්‍රෑන්ක්ලින් ඩී. රූස්වෙල්ට් විසින් නිකුත් කරනු ලැබූ අංක 6102 දරන ජනාධිපති විධානය විසින් එක්සත් ජනපද වැසියන් සතු ව තිබූ රන් ළඟ තබාගැනීමේ අයිතිය අහිමි කරනු ලැබීය. එම විධානයෙන් අණ කොට තිබුණේ එක්සත් ජනපද පුරවැසියන් සන්තක ව තිබූ සියලු රන් කාසි, ඝන රන් සහ රන් සහතික එම වසරේ මැයි 1 දා වන විට ෆෙඩරල් සංචිත බැංකුවට ලබාදිය යුතු බවත් ඒ වෙනුවෙන් ට්‍රෝයි අවුන්සයකට ඩොලර් 20.67 පදනම යටතේ මුදල් ලබාගැනීමට හැකි බවත් ය. මේ අයුරින් ජනතාව සතු ව තිබූ සියලු රන් රාජසන්තක කළ එක්සත් ජනපද රජය 1934 ජනවාරි මාසයේ දී පැන වූ රන් සංචිත පනත (Gold Reserve Act) මඟින් ගනුදෙනු සඳහා රන් යොදාගැනීමේ ඉඩ මුලුමනින් ම අවුරා දැම්මේ ය. එයට අමතර ව, රන් ට්‍රෝයි අවුන්සයක මිල ඩොලර් 35 ක් දක්වා ඉහළ දැම්මේ ය.

ඒ සමඟ ම, රන් ට්‍රෝයි අවුන්සයක මිල එක්සත් ජනපද ඩොලර් 35 සීමාවෙහි සිර කෙරිණි. 1944 ජූලි මාසයේ දී ඇති කරගත් බ්‍රෙට්න්වුඩ්ස් එකඟතා අතරට එක්සත් ජනපද ඩොලරයක් රන් ග්‍රෑම් 0.888671 කට (එනම්, රන් ට්‍රෝයි අවුන්සයක් ඩොලර් 35 කට) හුවමාරු කරගත හැකිය යන්න ද එක් කෙරිණි. ඒ අනුව රන් වටිනාකම සහ ඩොලරය අතර බැම්ම ජාත්‍යන්තර වශයෙන් ද තහවුරු විය. මේ ආකාරයෙන් බ්‍රෙට්න්වුඩ්ස් එකඟතාව යටතේ ඩොලරයේ වටිනාකම රන් සමඟ ගැටගැසුණු අතර අනෙක් ව්‍යවහාර මුදල්වල වටිනාකම ඩොලරය හා බැඳිණි. ඒ අනුව, රන් ලබා දී ඒ වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් ලබාගැනීමටත් එයට ප්‍රතිපක්ෂ ව එක්සත් ජනපද ඩොලර් ලබා දී රන් ලබාගැනීමටත් අවස්ථාවක් උදාවිය. කෙ සේ වුව ද, මෙම පරිවර්තන කාර්යය තනි පුද්ගලයන් හට කළ හැකි එකක් නො වී ය. එය කළ හැකි වූයේ අදාළ මහ බැංකුවලට පමණකි.


1834 සිට 1971 දක්වා කාලය තුළ දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂ ව රන් මිල පැවැති ආකාරය ප්‍රස්ථාර ගත කළ හොත් දළ වශයෙන් ලැබෙනු ඇත්තේ 1 වන රූප සටහනෙහි දැක්වෙන ආකාරයේ නිරූපිතයකි. කෙ සේ වුව ද, රන් මිල සහ එක්සත් ජනපද ඩොලරය අතර දීගයේ අවසානය ප්‍රස්ථාරයේ දැක්වෙන ආකාරයට සුමට එකක් නො වී ය. එයට හේතුව වූයේ රන් සඳහා වෙළෙඳපොළක් ද පැවැතීම ය.

එක්සත් ජනපදය තුළ රන් ගනුදෙනු කිරීම නවතා දමා තිබුණ ද ලොව බොහෝ රටවල රන් වෙළෙඳාම සිදු කෙරිණි. රන් සඳහා ඉතිහාසයේ මුළුල්ලේ ම පැවැතියේ නො සිඳෙන ඉල්ලුමකි. නිධිවලින් උකහා ගෙන පිරිසිදු කළ රන් තොග නිරන්තරයෙන් වෙළෙඳපොළට ගලා ආ අතර රන් මිල දී ගැනීමේ බලාපොරොත්තුවෙන් ගනුදෙනුකරුවෝ ද වෙළෙඳපොළට ඇදී ආහ. විසිවන සියවස උදාවන විට රන් වෙළෙඳපොළ ද දැවැන්ත එකක් බවට පත් ව තිබිණි. ඒ සමඟ ම රන් මිල නියම කිරීමේ ක්‍රමයක උදාව ද සනිටුහන් විය. ඒ, 1919 දී ලන්ඩන් රන් මිල නියම කිරීමේ කටයුත්ත (London Gold Fix) ඇරඹීමත් සමඟිනි. ඒ හේතුවෙන් ලෝකයේ ප්‍රධානතම රන් වෙළෙඳපොළ ලන්ඩනයේ ස්ථාපිත විය. රන් නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ තම රන් තොග ලන්ඩන් රන් වෙළෙඳපොළට යොමු කළ අතර එය කරා රන් මිල දී ගන්නෝ ද ඇදී ආහ. කෙ සේ වුව ද, දෙවන ලෝක

යුද්ධය නිසා 1939 දී වසා දමන ලද ලන්ඩන් රන් වෙළෙඳපොළ නැවත විවෘත කෙරුණේ 1954 වසරේ දී ය.

**1 වන රූප සටහන**

**නිල රන් මිල: 1834 සිට 1971 දක්වා (එ. ජ. ඩොලර්)**




මෙ ලෙසින් නැවතත් කරළියට ආ රන් වෙළෙඳපොළ විසින් රන් මිල කෙරෙහි බලපෑම් එල්ල කරන්නට විය. රන් ට්‍රෝයි අවුන්සයක් සඳහා වන වෙළෙඳපොළ මිල යම් සීමාවක් තුළ විචලනය විය. එම විචලනය ඩොලර් 34.83 සහ 35.17 අතර සිදුවන තාක් ගැටලුවක් මතු නො වී ය. මෙම සීමාව ගණන් බලා තිබුණේ ද සාධක කිහිපයක් සළකා බැලීමෙනි. නිව්යෝර්ක් නුවර ෆෙඩරල් සංචිත බැංකුවේ දී රන් සහ ඩොලර් හුවමාරු කෙරුණේ සත 8.75 ක කොමිස් මුදලකට යටත් ව ය. ෆෙඩරල් සංචිත බැංකුව විසින් රන් ට්‍රෝයි අවුන්සයක් මිල දී ගනු ලබන්නේ ඩොලර් 34.9125 කට ය. විකුණනු ලබන්නේ ඩොලර් 35.0875 කට ය. මිල සීමාව හඳුනාගැනීමේ දී සැළකූ අනෙක් සාධකය වන්නේ අත්ලන්තික් සාගරය හරහා රන් ප්‍රවාහණය සඳහා වන පිරිවැය යි. නාවික හා රක්ෂණ ගාස්තු සැළකූ විට එම පිරිවැය ට්‍රෝයි අවුන්සයකට සත 8 ක් සත 10 ක් පමණ විය. මෙම පිරිවැය සත 8 ක් ලෙසින් උපකල්පනය කළහොත් ෆෙඩරල් සංචිත බැංකුවෙන් රන් ට්‍රෝයි අවුන්සයක් මිල දී ගෙන ලන්ඩනයට ගෙන ඒමට ඩොලර් 35.1675 ක් වැය වෙයි. විවෘත වෙළෙඳපොළෙහි රන් මිල උඩත් සීමාව ඩොලර් 35.17 කට ආසන්න ව පැවැතියේ එ බැවිනි. යම් අයුරකින් රන් මිල අඩු වූ අවස්ථාවක ඩොලර් 34.83 කට රන් ට්‍රෝයි අවුන්සයක් ලන්ඩන් වෙළෙඳපොළින් මිල දී ගන්නා මහ බැංකුවකට එය තවත් සත 8 ක් වැය කර නිව්යෝර්ක් නුවරට ගෙන යා හැකි ය. එවිට එහි මුළු පිරිවැය වනුයේ ඩොලර් 34.91 කි. රන් මිලෙහි යටත් සීමාව 34.83 ක් ආසන්නයේ වීම එයින් පැහැදිළි කෙරෙයි.


යම් හෙයකින් ලන්ඩන් වෙළෙඳපොළෙහි රන් මිල ඩොලර් 35.18 ඉක්මවුවහොත් ෆෙඩරල් සංචිත බැංකුවෙන් රන් මිල දී ගෙන ඒවා ලන්ඩන් වෙළෙඳපොළෙහි විකුණා ලාභ ඉපැයීමේ හැකියාව මහ බැංකුවකට හිමිවෙයි. එ ලෙසින් ම, රන් අගය ඩොලර් 34.82 ට වඩා අඩුවුවහොත් ලන්ඩනයෙන් රන් මිල දී ගෙන ඒවා ෆෙඩරල් සංචිත බැංකුවට විකුණා ලාභ ඉපැයීමේ හැකියාව මහ බැංකුවකට ලැබෙයි. මෙම කටයුත්ත වැළැක්වීම සඳහා විවෘත වෙළෙඳපොළෙහි රන් මිල ඩොලර් 34.83 සහ 35.17 අතර පවතින සේ පාලනය කරගත යුතු විය. ඒ මත ඩොලරයේ රන් වටිනාකම ආරක්ෂා විය. මෙම ලිපියෙන් විස්තර කෙරෙන්නේ එ ලෙසින් ඩොලරයේ රන් වටිනාකම රැකගැනීමට කළ උත්සාහයකි.

1951 සහ 1957 දෙවසර තුළ දී හැරෙන්නට, 1950 න් ඇරඹුණු දශකය මුළුල්ලේ ම ඇමෙරිකානු එක්සත් ජනපදයෙන් වාර්තා වූයේ ගෙවුම් ශේෂයේ හිඟයකි. පළමු ඉන්දු - චීන යුද්ධයට හවුල්වීමත්, කොරියානු යුද්ධයට සම්බන්ධවීමත් නිසා එක්සත් ජනපදයේ යුද වියදම් වැඩෙමින් තිබිණි. දෙවන ලෝක යුද්ධයෙන් විනාශ වූ යුරෝපය නැවත ගොඩනැංවීමට කළ ආධාර නිසා ද විශාල සමායතන විසින් විදේශයන්හි කළ ආයෝජන නිසා ද එක්සත් ජනපදයෙන් පිටතට ප්‍රාග්ධනය ගලා යන්නට විය. මේ කරුණු නිසා එක්සත් ජනපද ආර්ථිකයේ ශක්තිය පිරිහෙන්නට විය.

කෙ සේ වුව ද, බ්‍රෙට්න් වුඩ්ස් එකඟතාවට අනුව තවදුරටත් ෆෙඩරල් සංචිත බැංකුව කරා රන් ගලා ආ අතර එයට හුවමාරු වශයෙන් ඩොලර් නිකුත් කෙරිණි. මහ බැංකු විසින් මුල් වරට තම පරිවර්ත්‍යතා අයිතිය ක්‍රියාවට නංවා ඩොලර් වෙනුවට රන් ආපසු ලබාගැනීමට යොමු වූයේ 1958 වසරේ දී ය. එම කටයුත්ත නිසා මෙට්‍රික් ටොන් 20,312 ක් ව තිබූ එක්සත් ජනපද රන් සංචිතය සියයට 10 කින් (එ නම්, මෙට්‍රික් ටොන් 18,290 දක්වා) පහත වැටිණි. එයින් නො නැවතී 1959 දී තවත් සියයට 5 කින් ද 1960 දී සියයට 9 කින් ද රන් සංචිත පහත වැටිණි. කෙ සේ වුව ද, එයට ප්‍රතිචාර වශයෙන් ඩොලර් සංසරණයේ අඩුවීමක් නම් සිදු නො වී ය. ෆෙඩරල් සංචිත බැංකුව විසින් නො කඩවා ම සංසරණය සඳහා ඩොලර් නිකුත් කරන්නට විය. එ ලෙසින් සංසරණයට එක් වූ ඩොලර් සඳහා පිටුබලයක් වශයෙන් පැවැතියේ අඩු රන් ප්‍රමාණයකි. තවදුරටත් ආර්ථිකය පිරිහීමට ලක්වීමෙන් වළක්වා ගැනීම උදෙසා ඩොලරය අවප්‍රමාණය කිරීමට එක්සත් ජනපදය පෙළඹෙනු ඇති බවට කට කථා පැතිර යන්නට විය.

**රූප සටහන 2**

**රන් මිල විචලනය: 1957 - 1958**





**මූලාශ්‍රය:** The Data Hub

ඩොලරය අවප්‍රමාණය නො කර තවදුරටත් අනුගමනය කළ හැකි විකල්ප කෙරෙහි එක්සත් ජනපද රජයේ අවධානය යොමු වී තිබිණි. මුදල් පරිවර්ත්‍යතා අයිතිය ක්‍රියාවට නැංවීමට විදේශීය මහ බැංකු යොමුවීම වැළැක්වීමේ විකල්ප ක්‍රියාමාර්ග ද ඒ අතර විය. ඒ යටතේ පරිවර්ත්‍යතා අයිතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍යතාවක් නැති බව ද අනාගතය කෙරෙහි බිය විය යුතු නැති බව ද ඒ බැංකුවලට ඒත්තු ගැන්විණි. එයට අමතර ව, එක්සත් ජනපද වැසියන්ට තව තවත් සම්බාධක පැනවෙන්නට විය. ඒ යටතේ මුලින් ම ඇමෙරිකානු සංචාරකයන්ට එතෙර සංචාරවල යෙදීම සීමා කෙරිණි. එයින් නො නැවතී විදේශවල කෙරෙන ඇමෙරිකානු පුද්ගලික ආයෝජන වැළැක්විණි. 1958 වන විට ලන්ඩන් රන් වෙළෙඳපොළෙහි රන් විකුණුනේ ඩොලර් 35.18 උඩත් සීමාව ආසන්නයට වන්නට ය. (පෙර වසරේ දී - එ නම්, 1957 දී, රන් මිල නිරන්තරයෙන් ම ඩොලර් 35 සීමාවට පහළින් විය. 2 වන රූප සටහන බලන්න). අවුරුද්දක් මුළුල්ලේ එක දිගට ම ඩොලර් 35 අගයට ඉහළින් රන් අලෙවි වීම නිසා එහි ආපසු ගමනක් පිළිබඳ අපේක්ෂාවක් කිසිවකු තුළත් නො වී ය. සැමකකු ගේ ම අපේක්ෂාව වූයේ ඩොලරය අවප්‍රමාණය කරාවිය යන්න ය.

මහ බැංකු දිගින් දිගට ම තමන් ගේ පරිවර්ත්‍යතා අයිතිය ක්‍රියාත්මක කරන්නට විය. 1931 වසරට පසු එක්සත් ජනපදයෙන් වාර්තා වූ විශාලතම සංචිත බාදනය 1960 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූයේ ද ඒ හේතුවෙනි. ඒ වනවිට, එක්සත් ජනපද ජනාධිපතිවරණයෙන් ජෝන් එෆ්. කෙනඩි ජයගන්නා බව ද තහවුරු වෙමින් තිබිණි. කෙනඩි ප්‍රතිඥා දී තිබුණේ පොලී අනුපාතික තවදුරටත් පහත හෙළීමට ය. එයට අමතර ව, ඔහු ගේ වැඩපිළිවෙල අනුව රාජ්‍ය වියදම් ඉහළ යෑම පිළිබඳ ව සැකයක් ද නො වී ය. ඒ බැවින් කාගේත් බලාපොරොත්තුව වූයේ එක්සත් ජනපදයෙන් පිටතට රන් ගලා යෑම තවදුරටත් ඉහළ යෑම ය. ඩව් ජෝන්ස් කාර්මික සාමාන්‍ය දර්ශකය 1960 අගෝස්තු මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා වූ කාලය තුළ සියයට 12 කින් පහත වැටුණේ ය. ඒ, 1958 ට පසු වාර්තා වූ පහළ ම අගය යි.

**රූප සටහන 3**

**රන් මිල විචලනය: 1959 - 1960**





**මූලාශ්‍රය:** The Data Hub

මෙම ආර්ථික හා සාමාජයීය වාතාවරණය තුළ ලන්ඩන් රන් වෙළෙඳපොළ තුළ පළමු වතාවට රන් මිල ඩොලර් 35.20 සීමාව ඉක්මවා ගියේ ය. ඔක්තෝබර් 20 වන දා වන විට එය ඩොලර් 36 සීමාවට ද ළඟා විය. (3 වන රූප සටහන බලන්න) ඒ සමඟ ම, ඩොලර් 35.17 ට පහළින් වෙළෙඳපොළ රන් මිල රැක ගැනීමට කරන උත්සාහය ඉතාමත් ප්‍රශ්නකාරී එකක් බවට පත්විය. තවත් සතියක් ඉක්ම යෑමටත් පෙර රන් පොරය තවදුරටත් උත්සන්න වූ අතර එක් අවස්ථාවක දී ඩොලර් 41 දක්වා ම මිල ඉහළ ගියේ ය. අවසානයේ දී ඩොලර් 38 සීමාවෙහි රන් මිල නියම වන්නට විය. රන් මිල ඩොලර් 41 ක් වීමෙන් (එ නම්, නිල වශයෙන් පනවා තිබූ මිල සියයට 17 කින් ඉක්මවා යෑමෙන්) ගෝලීය මුදල් ක්‍රමයේ විශ්වසනීයත්වය ඉතා බරපතල ආකාරයෙන් ප්‍රශ්න කෙරෙන්නට විය.

ඩොලර් 35 ක් ගෙවා මිල දී ගන්නා රන් අවුන්සයක් විශාල ලාභයක් තබාගෙන වෙළඳපොළෙහි විකිණිය හැකි නම් රන් සහ ඩොලර් අතර වන සාම්‍යය පිළිගත නො හැකි එකක් බවට පත්වෙයි. තව ද, ඩොලර් 35 කට නිව්යෝර්ක් ෆෙඩරල් සංචිත බැංකුවෙන් රන් අවුන්සයක් මිල දී ගැනීමේ වරය විදේශ මහ බැංකුවලට හිමි ව තිබිය දී ඒ අයිතිය ක්‍රියාත්මක කොට ලබාගන්නා රන් ලන්ඩන් වෙළෙඳපොළේ ඩොලර් 36 කට, 38 කට විකිණිය හැකි නම් එයින් එක්සත් ජනපදයේ රන් සංචිත බාදනය වීම කිසි ලෙසකින් හෝ වැළැක්විය හැකි නො වනු ඇත. තවදුරටත් කල් මැරීමේ අවස්ථාවක් නො වී ය. එළඹ තිබුණේ වහා වහා ක්‍රියාත්මක විය යුතු අවස්ථාවකි. (4 වන රූපසටහන බලන්න)

**රූප සටහන 4**

**ඇමෙරිකා එක්සත් ජනපදයේ රන් සංචිත: 1950 - 1968**





**මූලාශ්‍රය:** World Gold Council

එංගලන්ත බැංකුව සමඟ නිල නොවන එකඟතාවක් ඇති කරගැනීමට ෆෙඩරල් සංචිත බැංකුව යොමු වූයේ ඇති ව තිබූ අනතුරුදායක වාතාවරණයෙන් අත්මිදීමේ අටියෙනි. ඒ යටතේ එංගලන්ත බැංකුවට උවමනා රන් සංචිත අභිමත පරිද්දෙන් ලබාදීමට ෆෙඩරල් සංචිත බැංකුව එකඟවිය. මෙ ලෙසින්

රන් සැපයුම තර කිරීමේ අරමුණ වූයේ ඉහළ නැගෙමින් තිබූ මිල මැඩ පැවැත්වීම ය. එංගලන්ත බැංකුව රන් විකිණීම ඇරඹුවේ ය. එයට අමතර ව, ඇමෙරිකානු රජය ද රන් ඉල්ලුම මැඩලීමේ ක්‍රියාමාර්ගවලට යොමු වන්නට විය. ඩ්වයිට් අයිසන්හවර් ජනාධිපතිවරයා තමන් ගේ දෙවැනි ධූර කාලය ද අවසන් කරමින් සිටියේ ය. රූස්වෙල්ට් විසින් 1933 දී දේශීය රන් ඉල්ලුම මැඩපවත්වා තිබුණ ද ඇමෙරිකානුවෝ විදේශවල දී රන් මිල දී ගැනීම නො කඩවා සිදු කළහ. අයිසන්හවර් කළේ ඒ කාර්යය ද තහනම් කිරීම යි. ඒ අනුව, ඇමෙරිකානුවන්ට විදේශයක දී රන් මිල දී ගැනීමට තිබූ ඉඩකඩ ද ඇහිරිණි. මේ උපක්‍රමවල ඵල ක්‍රම ක්‍රමයෙන් ලැබෙන්නට විය. 1961 මාර්තු මාසය වන විට රන් මිල ඩොලර් 35.10 දක්වා අඩු විය. (5 වන රූපසටහන බලන්න)

**රූප සටහන 5**

**රන් මිල විචලනය: 1961 - 1962**




**මූලාශ්‍රය:** The Data Hub

රන් මිල පාලනය කරගත්ත ද ඒ වෙනුවෙන් ස්ථිරසාර පිළියමක් යෙදීමේ අවශ්‍යතාව නො අඩු ව ඉස්මතු ව තිබිණ. කළ යුතු ව තිබුණේ රන් සැපයුමෙහි හිඟයක් නැති බවට විශ්වාසයක් වෙළෙඳපොළ තුළ ජනිත කරවීම යි. මෙය ඇමෙරිකා එක්සත් ජනපදයට තනි ව කළ හැකි එකක් නො වේ. ඇත්තෙන් ම ඇති වූ අනතුරෙන් ගැලවුනේ ද තනි ව ම නො වේ. ඒ සඳහා මහා බ්‍රිතාන්‍යයේ සහාය ද නො අඩු ව ම හිමි විය. එහෙයින් විධිමත් සාමූහික ප්‍රයත්නයක අවශ්‍යතාව පිළිබඳ ව සැකයක් නො වී ය. ඒ වෙනුවෙන් බටහිර මහ බැංකු හතක් හවුල් කරගැනීමට ඇමෙරිකා එක්සත් ජනපදය සමත් විය. අනෙකුත් මහ බැංකු විසින් සපයන රන් ප්‍රමාණය ම තනි ව සැපයීමට ෆෙඩරල් සංචිත බැංකුව එකඟ විය. ලන්ඩන් රන් හවුල බිහි විය.

1 වන සංඛ්‍යා සටහනින් දක්වා ඇත්තේ ආරම්භක අවස්ථාවේ දී ඒ ඒ මහ බැංකු විසින් රන් හවුලට දායක වූ ආකාරය යි. දායක ප්‍රතිශතයත්, දායක වූ රන් ප්‍රමාණයත් (ටොන්වලින්), එහි වටිනාකමත් (එක්සත් ජනපද ඩොලර්වලින්) මෙහි දක්වා ඇත.

මේ රන් හවුල හුදෙක් ම හිඟකම වසා දක්වන උපක්‍රමයක් පමණක් ම නො වී ය. එය ඉතා ක්‍රියාකාරී ව රන් වෙළෙඳපොළට සම්බන්ධ ව කටයුතු කරන්නට විය. ඩොලර් 35.08 ට අඩු මිලකට අලෙවි වන විට රන් මිල දී ගත් හවුල වෙළෙඳපොළ මිල ඩොලර් 35.20 ආසන්න වන විට රන් විකුණුවේ ය. මේ උපක්‍රමය විසින් ලන්ඩන් රන් වෙළෙඳපොළෙහි මිල ඉතා හොඳින් පාලනය වන්නට විය. 1962 ඔක්තෝබර් මාසයේ දී කියුබානු මිසයිල අර්බුදය පවතින විට ද රන් වෙළෙඳපොළ උණුසුම් වන්නට විය. ඒ කාලය තුළ දී රන් සඳහා විශාල ඉල්ලුමක් ද ඇති විය. ඇත්තෙන් ම එය 1960 වර්ෂයේ ඇති වූ ඉල්ලුමට ඉතා වැඩි එකකි. එහෙත්, වෙළෙඳපොළේ රන් මිල ඩොලර් 35.20 සීමාව ඉක්මවා නො ගියේ ය. රන් මිල දමනය වී තිබිණි. එම වසරේ දී පමණක් නො ව, 1965 පෙබරවාරි මාසය වන තෙක් ම රන් මිල ඩොලර් 35.08 ට ආසන්න සීමාවක රැඳී පැවැතිනි. එයින් පසු ව වුව ද,

**සංඛ්‍යා සටහන 1**

**ලන්ඩන් රන් හවුලට දායක වූ ආකාරය**

| රට | ප්‍රතිශතය (%) | ප්‍රමාණය (ටොන්) | වටිනාකම (ඩොලර් මිලියන) |
|---|---|---|---|
| එක්සත් ජනපදය | 50 | 120 | 135 |
| ජර්මනිය | 11 | 27 | 30 |
| එක්සත් රාජධානිය | 9 | 22 | 25 |
| ප්‍රංශය | 9 | 22 | 25 |
| ඉතාලිය | 9 | 22 | 25 |
| බෙල්ජියම | 4 | 9 | 10 |
| නෙදර්ලන්තය | 4 | 9 | 10 |
| ස්විට්සර්ලන්තය | 4 | 9 | 10 |

**මූලාශ්‍රය:** Nolan Chart වෙබ් අඩවිය


1968 මාර්තු දක්වා ම රන් මිල ඩොලර් 35.20 ඉක්මවා යා නො දී රැක ගැනීමට ලන්ඩන් රන් හවුල සමත් විය.

කෙ සේ වුව ද මේ ගමන ඉතා සුමට ව සිදු වූ එකක් නො වේ. 1963 සහ 1964 වසරවල දී පැවැතියේ ඉතා සහනදායි වාතාවරණයකි. ඇමෙරිකා එක්සත් ජනපදයේ රන් සංචිත හොඳින් ආරක්ෂා විය. එයින් විදෙස් මහ බැංකුවලට ලබාගත හැකි වූයේ ඉතා සුළු ප්‍රමාණයකි. ඒ කාලය තුළ දී ලන්ඩන් රන් හවුල විසින් සිදු කරනු ලැබුවේ වෙළෙඳපොළට රන් සැපයීම නො ව හැකිතාක් රන් මිල දී ගැනීම ය. එ හෙයින්, එම කාලය තුළ දී රන් හවුල ඉටු කළේ මිල මැඩපවත්වන්නකු ගේ කාර්යය නො වේ. මිල රැකගන්නකු ගේ කාර්යයයි. ඩොලරයේ පැවැත්ම අන් කවර දාකටත් වඩා ස්ථාවර විය. (6 වන රූපසටහන බලන්න) බ්‍රෙට්න්වුඩ්ස් එකඟතාවන් ගේ මහිමය කා හටත් හොඳින් වැටහී තිබිණි.

එහෙත් 1964 අගෝස්තු 2 වන දා උතුරු වියට්නාමයට ආසන්න ව ටොන්කින් (Tonkin) බොක්කේ ඇති වූ සිදුවීමත් අගෝස්තු 4 වන දා එහි ම ඇති වූ බවට වාර්තා වූ ව්‍යාජ සිදුවීමත් නිසා ලෝකය නැවතත් උණුසුම් වන්නට විය. ඒ සමඟ ම, ජනාධිපති ලින්ඩන් බී ජොන්සන් වියට්නාම් යුද්ධයට මුල පිරී ය. 1965 වසරේ දී යුද්ධය උත්සන්න වීමත් සමඟ ම එක්සත් ජනපදයේ යුද වියදම් ඉහළ නඟින්නට විය. එයට අමතර ව, ජනාධිපති ජොන්සන් විසින් දියත් කළ "මහා සමාජය" වැඩපිළිවෙල නිසා ද රජයට තවත් වැය බරක් එක් විය. මේ සියල්ල සඳහා මුදල් සොයාගනු ලැබුවේ රජයේ සුරැකුම් ෆෙඩරල් සංචිත බැංකුවට විකිණීමෙනි. ප්‍රතිඵලය වූයේ තව තවත් නව මුදල් සංසරණයට එක්වීම ය.

**රූප සටහන 6**

**රන් මිල විචලනයඃ 1962 - 1965**





**මූලාශ්‍රය**: The Data Hub

එක්සත් ජනපදයේ ගෙවුම් ශේෂ හිඟය දිගින් දිගට ම වර්ධනය විය. (7 වන රූප සටහන බලන්න). විදේශ මහ බැංකු විසින් පරිවර්ත්‍යතා අයිතිය ක්‍රියාත්මක කිරීම නිසා ද ලන්ඩන් වෙළෙඳපොළට රන් හවුල හරහා දිගින් දිගට ම රන් නිකුත් කිරීම නිසා ද එක්සත් ජනපදයේ රන් සංචිත විශාල වශයෙන් හීන වන්නට විය. 1965 වසරේ දී පමණක් රන් සංචිතය සියයට 9 කින් පහත වැටුණේ ය. සමපේක්ෂකයෝ ද දිගින් දිගට ම රන් මිල දී ගන්නට වූහ. ඒ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ රන් මිල ඩොලර් 35.20 ට ආසන්නයට තල්ලු වී යෑම යි.

කෙ සේ වුව ද 1961 නොවැම්බර් මාසයේ දී ලන්ඩන් රන් හවුල ආරම්භ කිරීමෙන් අනතුරු ව පළමු වතාවට රන් මිල ඩොලර් 35.20 අගය ගත්තේ 1967 නොවැම්බර් මාසයේ දී ය. (8 වන රූප සටහන බලන්න) ඒ සඳහා බල පෑ කරුණු ගණනාවක් ම විය. වසර මුළුල්ලේ ම එංගලන්ත බැංකුවේ රන් තොග පිරිහෙමින් තිබිණි. ස්ටර්ලිං පවුමෙහි සැබෑ වටිනාකම ගැන සැක මතු ව එන්නට විය. 1967 ජූනි මාසයේ දී, ලන්ඩන් රන් හවුලෙන් ඉවත්වීමට ප්‍රංශ ජනාධිපති චාල්ස් ඩී ගෝල් තීරණය කළේ ය. වසරේ දෙවන භාගය වන විට මූල්‍ය සමපේක්ෂකයෝ පවුම් විකිණීමටත් ඩොලර් සහ වෙනත් මුදල් මිල දී ගැනීමටත් පටන් ගත්හ. එයට අමතර ව, සමපේක්ෂයෝ රන් මිල දී ගැනීම ද නො නවතා ම කරගෙන ගියහ. ෆ්‍රැන්ක්ෆර්ට් සිට ප්‍රිටෝරියා දක්වා වූ සෑම ප්‍රමාණයක ම නගරවල රන් විකිණෙන්නට විය. වසරේ ජූනි සිට ඔක්තෝබර් දක්වා ම රන් මිල රැඳුණේ ඩොලර් 35.19 හි ය. නොවැම්බර් මාසයේ දී ඩොලර් 35.20 දක්වා ම ඉහළ ගියේ ය. මේ තත්ත්වය තුළ ස්ටර්ලිං පවුම රැකගැනීම සඳහා බ්‍රිතාන්‍යයේ හැරල්ඩ් විල්සන් ගේ නායකත්වයෙන් යුතු කම්කරු රජයට ගත හැකි ව තිබුණේ එක ම එක තීරණයකි. වොෂින්ටනයෙන් එල්ල වූ දැඩි පීඩනය නො තැකූ බ්‍රිතාන්‍ය රජය ස්ටර්ලිං පවුමේ අගය සියයට 14 කින් (එනම්, ඩොලර් 2.80 සිට 2.40ට) අවප්‍රමාණය කිරීමට තීරණය කළේ ය. නොවැම්බර් 18 වන දා ගත් එම තීරණයෙන් පවුම රැකුණ ද ඩොලරය කෙරෙහි පීඩනය තවදුරටත් එල්ල වන්නට විය.

**රූප සටහන 7**


**එක්සත් ජනපදයේ ගෙවුම් ශේෂයඃ 1946 - 1969**




**මූලාශ්‍රයඃ එක්සත් ජනපද වෙළෙඳ දෙපාර්තමේන්තුව**

රූප සටහන 8

**රන් මිල විචලනය: 1961 නොවැම්බර් - 1967 දෙසැම්බර්**





**මූලාශ්‍රය**: The Data Hub

1967 ජුනි මාසයේ දී දියත් වූ හය දින යුද්ධය ඉක්මනින් අවසන් වුව ද ඒ නිසා ඇති කොට තිබූ දේශපාලනික අස්ථාවරත්වය සුළුපටු නො වේ. වියට්නාම් මහජන හමුදාව විසින් 1968 ජනවාරි 30 දා එල්ල කළ "නව අවුරුදු ප්‍රහාරය" නිසා එක්සත් ජනපදයට සිදුවූයේ තම යුද වියදම් විශාල වශයෙන් ඉහළ නැංවීමට ය. මෙම වාතාවරණය තුළ ඩොලරයේ සැබෑ වටිනාකම තවදුරටත් ප්‍රශ්නකාරී විය. මාර්තු 14 වන දා වන විට ඩොලර් 35.20 සීමාව රැකගැනීම සඳහා විකිණීමට සිදු ව තිබූ රන් ප්‍රමාණයේ වටිනාකම ඩොලර් බිලියන 2.75 කි. එය රන් හවුලේ සාමාජිකයන් ගේ සමස්ත සංචිත සියයට 10 කින් ඛාදනය වීමට සමාන විය. තවත් කළ යුතු දෙයක් ඉතිරි වී නො තිබිණි. පසු දින (එ නම් මාර්තු 15 සිකුරාදා දින) ලන්ඩන් රන් වෙළෙඳපොළ වසා දමන ලෙස මාර්තු 14 දා සවස එක්සත් ජනපද රජය බ්‍රිතාන්‍ය රජයෙන් ඉල්ලා සිටියේ ය.

එයට ප්‍රතිචාර වශයෙන් පුවත්පත් නිවේදනයක් නිකුත් කෙරුණේ බකිංහැම් මාළිගයෙනි. එම පුවත්පත් නිවේදනයෙන් දන්වා සිටියේ 1968 මාර්තු 15 වන සිකුරාදා දින ලන්ඩනයේ රන් වෙළෙඳපොළ වසා ඇති බවත් එ දින එක්සත් රාජධානිය සඳහා බැංකු නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් කොට ඇති බවත් ය. සාමාන්‍ය දේශීය අවශ්‍යතා සඳහා පමණක් මුදල් ගනුදෙනු කිරීමේ අවසරය බැංකුවලට හිමි විය. ව්‍යාපාර වස්තු වෙළෙඳපොළ ද වසා දැමිණි. මාර්තු 17 වැනි දා ඉරිදා, ලන්ඩන් රන් හවුල අවසන් කෙරිණි. ගෝලීය රන් වෙළෙඳපොළ තවදුරටත් වසා දැමීමට තීරණය කෙරුණු අතර මාර්තු 18 වැනි දා රැස් වූ එක්සත් ජනපද කොංග්‍රසය මුදල් නිකුත් කිරීමේ දී ෆෙඩරල් සංචිත බැංකුව විසින් පවත්වා ගත යුතු බවට නියම කොට තිබූ සියයට 25 ක රන් සම අවශ්‍යතාව ඉවත්කරනු ලැබීය. එයට අමතර ව, "මුදල්මය" නිල රන් වටිනාකමක් සහ "මුදල්මය නොවන" වෙළෙඳපොළ රන් වටිනාකමක් සඳහා අවකාශයක් උදාවිය. මුදල්මය රන් හුවමාරුවට පමණක් ෆෙඩරල් සංචිත බැංකුව තම වගකීම සීමා කරගත්තේ ය. ප්‍රතිඵලය වූයේ ඉතිහාසයේ මුල් වරට "රන් කවුළුවක්" විවර වීම ය.

රූප සටහන 9

**රන් මිල විචලනය: 1968 අප්‍රේල් - 1969 ඔක්තෝබර්**




**මූලාශ්‍රය**: The Data Hub

සති දෙකකට පසු වෙළෙඳපොළ විවෘත කළ විට රන් මිල ඩොලර් 38 දක්වා ඉහළ නැංගේ ය. එයින් පසු දිගින් දිගට ම, 1969 නොවැම්බර් දක්වා රන් මිල රැඳුණේ ඩොලර් 38 සීමාවෙන් ඉහළ ය. (9 වන රූප සටහන බලන්න) 1969 මැයි මාසයේ දී අදාළ කාලයට තුළ වාර්තා වූ ඉහළ ම මිල (එ නම්, ඩොලර් 43.46) වාර්තා විය. මෙ ලෙසින් ලන්ඩන් රන් හවුල බිඳ වැටීමේ සිට 1971 අගෝස්තු 15 දක්වා කාලය තුළ රන් මිලෙහි හැසිරීම වෙනම ලිපියකින් සාකච්ඡා කළ යුතු සිද්ධි දාමයකින් පිරුනකි. එහෙයින් ඒ පිළිබඳ සාකච්ඡාව ඉදිරි කලාපයකින් සිදු කෙරෙනු ඇත.

කෙ සේ වුව ද, 1954 දී නැවත ලන්ඩන් රන් වෙළෙඳපොළ විවෘත කළ දිනයේ සිට 1968 මාර්තු දක්වා මුදලේ ඉතිහාසය නො මැකෙන අයුරින් සනිටුහන් වූ එකක් බව නම් නිසැක ව ම කිව හැකි ය. එම කාලය තුළ රන් මිල හික්මවීම සඳහා මූල්‍ය අධිකාරීන් විසින් නො ගත් උත්සාහයක් නැත. ඩොලර් 35 ක තිරස් හැසිරීමක් රන් මිල සටහනකින් දුටු පමණින් ඩොලරය යනු ස්ථාවර ලෙසින් වටිනාකම් ගබඩා කළ හැකි මුදල් ඒකකයක් ය යන මායාව කෙනකු තුළ ඇති විය හැකි ය. එහෙත්, ක්‍රය ශක්තිය හීන වෙමින් තිබිය දී ඩොලරයෙහි අගය රන් ග්‍රෑම් 0.888671 කට බැඳ තැබීමට කළ උත්සාහය පරාජය දැක දැක කළ සටනක් විය. අවසානයේ ඒ සටන විය යුතු පරිද්දෙන් ම පරාජයෙන් අවසන් විය. එහෙත් ඒ වන විට ද ලෝක මුදල් ක්‍රමය තම ගැටලු අවසාන වශයෙන් විසඳාගෙන තිබුණේ නැත. ලන්ඩන් රන් හවුල බිඳ වැටීම තවත් රන් පොරයකට අවස්ථාවක් උදා කළේ ය. ඉදිරි "සටහන" කලාපයකින් ඒ පිළිබඳ ව සාකච්ඡා කෙරෙයි.✪

# විදේශ විනිමය අනුපාතිකයේ හැසිරීම

**නිලුකා පරණගම**

සහකාර අධ්‍යක්ෂිකා, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව

**විදේශ විනිමය අනුපාතිකය හැඳින්වීම**

යම් රටක ව්‍යවහාර මුදලෙහි බාහිර අගය වෙනත් රටක ව්‍යවහාර මුදලක් මඟින් මැන දැක්විය හැකි ය. මෙ ලෙස එක් රටක ව්‍යවහාර මුදල් ඒකකයක් තවත් රටක ව්‍යවහාර මුදල් ඒකකයක් සමඟ හුවමාරු කළ හැකි වටිනාකම විදේශ විනිමය අනුපාතිකය යනුවෙන් හැඳින්වේ. නිදහස් ආර්ථික ක්‍රමයක් තුළ දී, රටක ව්‍යවහාර මුදලෙහි බාහිර වටිනාකම විදේශ විනිමය සඳහා වන දේශීය වෙළෙඳපොළෙහි ඉල්ලුම් හා සැපයුම් සාධක මත තීරණය වෙයි. කෙ සේ වෙතත්, පාලිත ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක වන විට රටෙහි ව්‍යවහාර මුදලෙහි බාහිර වටිනාකම ද පාලනය කෙරෙයි. බාහිර ව්‍යවහාර මුදලක වටිනාකම හා බැඳුණු අනුපාතිකයක් පවත්වා ගැනීමෙන් හෝ රජයේ සෘජු මැදිහත්වීමෙන් මුදලෙහි බාහිර අගය තීරණය කිරීම මඟින් හෝ මෙය සිදු කෙරෙයි. ව්‍යවහාර මුදල් පැසක් හා බැඳුණු ලෙසින් අගය පවත්වාගෙන යෑමෙන් ද ව්‍යවහාර මුදලක බාහිර අගය පාලනය කරනු ලැබෙයි. කෙසේ වෙතත්, වර්තමානයේ දී ලෝකයේ රාජ්‍යයෝ බහුතරයක් පාවෙන හෝ පාලිත පාවෙන විනිමය අනුපාතික ක්‍රම අනුගමනය කරති.

ව්‍යවහාර මුදලක බාහිර අගය තීරණය වීමේ දී වෙළෙඳාම, ආයෝජනය, සංචාරක කටයුතු සහ භූ-දේශපාලනික අවදානම මත රැඳුණු වෙළෙඳපොළ බලවේග විසින් මූලික කාර්යයභාරයක් ඉටුකරනු ලබයි. නිදසුනක් වශයෙන්, යම් රටකට පිවිසෙන සංචාරකයකු ගේ කටයුතු ඇසුරෙන් මෙය පහදා දිය හැකි ය. මෙම සංචාරකයා විසින් තමන් ගේ පිරිවැය දැරිය යුතු වන්නේ ඔහු සංචාරය කරනු ලබන රටෙහි ව්‍යවහාර මුදලිනි. එබැවින්, එම සංචාරකයාට තමන් සතු ව්‍යවහාර මුදල් අදාළ රටෙහි (එ නම්, ඔහු සංචාරයෙහි යෙදෙන රටෙහි) ව්‍යවහාර මුදල්වලට හුවමාරු කරගත යුතු වෙයි. මේ ආකාරයේ හුවමාරුවක් විසින් අදාළ රටෙහි ව්‍යවහාර මුදල් කෙරෙහි ඉල්ලුමක් ඇතිවෙයි.

යම් රටකට අයත් වෙළෙඳ සමාගමක් වෙනත් රටක් සමඟ ව්‍යාපාරික කටයුත්තකට යොමු වූ කල්හි ද එම විදේශ රටෙහි ව්‍යවහාර මුදල කෙරෙහි ඉල්ලුමක් ඇති වෙයි. එහි දී පෙර කී වෙළෙඳ සමාගම විසින් දෙවනුව කී රටෙහි ව්‍යවහාර මුදලින් තම ව්‍යාපාරික අවශ්‍යතාව උදෙසා ගෙවීම් කළ යුතු ය. තව ද, යම් ආයෝජකයකු විසින් වෙනත් රටක ආයෝජන කටයුත්තකට යොමුවන විට ද එ ලෙස ආයෝජන කාර්යයෙහි නිරත ව්‍යවහාර මුදලින් එම කාර්යය සිදු කළ යුතු වෙයි. එය විසින් ද එම ආයෝජනය ලබාගන්නා රටෙහි ව්‍යවහාර මුදල් කෙරෙහි ඉල්ලුමක් ඇති කරයි.

මෙ කී සියලු අවශ්‍යතාවල දී විදේශීය හා දේශීය ව්‍යවහාර මුදල් අතර හුවමාරුවක් සිදුවන අතර ඒ සඳහා පහසුකම් සළසනු ලබන වෙළෙඳපොළක් ද පවත්වා ගත යුතු වෙයි. එ ලෙස විවිධ රටවල ව්‍යවහාර මුදල් හුවමාරුව සිදුවන්නේ විදේශ විනිමය වෙළෙඳපොළ තුළ දී ය.

**විදේශ විනිමය වෙළෙඳපොළ**

ඒ ඒ රටවලට අයත් ව්‍යවහාර මුදල් හුවමාරුව සඳහා ලෝක ව්‍යාප්ත මට්ටමින් විමධ්‍යගත ව විසිර පවත්නා ආයතනික ව්‍යුහය විදේශ විනිමය වෙළෙඳපොළ වශයෙන් හැඳින්වෙයි. විදේශ විනිමය වෙළෙඳපොළට පැමිණෙන ව්‍යවහාර මුදල් විකුණන්නෝ සහ මිල දී ගන්නෝ සති අන්තයේ දී හැර අන් සෑම දිනයක ම විසි හතර පැය මුළුල්ලේ ම ගනුදෙනුවල නිරතවෙති. අධිකාරියක් හෝ රජයක් හෝ විසින් පාලනය නො කරනු ලබන ව්‍යවහාර මුදල්වල සාපේක්ෂ වටිනාකම විදේශ විනිමය වෙළෙඳපොළේ දී තීරණය වෙයි.

මුදල් හුවමාරුව තුළින් විදේශ විනිමය වෙළෙඳපොළ ජාත්‍යන්තර වෙළෙඳාමත් ආයෝජනයත් පහසු කරවයි. රුපියල්වලින් ගනුදෙනු කරන ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයකට ස්ටර්ලිං පවුම්වලින් මුදල් ගෙවා බ්‍රිතාන්‍යයෙන් භාණ්ඩ ආනයනය කළ හැකි වීම මේ සඳහා නිදසුනක් වශයෙන් දැක්විය හැකි ය. තව ද එහි ක්‍රියාකාරීත්වය විසින් සමපේක්ෂණ කටයුතුවලට ද මං සැළසෙයි.

විදේශ විනිමය ගනුදෙනුවක දී කෙරෙන්නේ එක් වර්ගයක ව්‍යවහාර මුදලකින් ගෙවීම් කොට වෙනත් වර්ගයක ව්‍යවහාර මුදලක් මිල දී ගැනීම ය. දෙවන ලෝක යුද්ධයෙන් අනතුරු ව බ්‍රෙට්න්වුඩ්ස් ක්‍රමය විසින් විදේශ විනිමය අනුපාතික තීරණය

කිරීම 1970 දශකය ආරම්භයේ දී ම අත්හැර දැමීමෙන් අනතුරු ව විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු ආරම්භ විය. බොහෝ රාජ්‍යයන් පාවෙන විදේශ විනිමය අනුපාතික ක්‍රමයට නැඹුරුවීම නිසා මේ සඳහා අඩිතාලම සැපයිණි.

කරුණු ගණනාවක් නිසා විදේශ විනිමය වෙළෙඳපොළ විශේෂත්වයක් ගනියි.

1. ඉතා ඉහළ ද්‍රවශීලතාවකින් යුතු ලොව විශාලතම වත්කම් තොගය මෙම වෙළෙඳපොළ හරහා ගනුදෙනු වෙයි.
2. ලෝක ව්‍යාප්ත ව සෑම රටක ම ක්‍රියාත්මක වෙයි.
3. සති අන්තයේ හැර දිනයේ පැය 24 මුළුල්ලේ ම ක්‍රියාත්මක වෙයි.
4. විවිධ වූ සාධක හේතු කොටගෙන විදේශ විනිමය අනුපාතික උච්චාවචනය වෙයි.
5. ස්ථාවර ආදායමක් ලබාදෙන අනෙකුත් වෙළෙඳපොළ හා සසඳන කල ඉතා පහළ ආන්තික ලාභයක් ලබාදෙන්නකි.
6. වෙළෙඳ තොගයේ ප්‍රමාණය අනුව ආන්තික ලාභයේ හෝ පාඩුවේ හෝ තරම තීරණය වෙයි.

මහ බැංකුවල මැදිහත්වීම තිබිය දී වුව ද, විදේශ විනිමය වෙළෙඳපොළ වෙතින් පූර්ණ තරඟකාරීත්වයකට ආසන්න තත්ත්වයක් පෙන්වයි.

## විනිමය අනුපාතික රජයනය

අනෙකුත් ව්‍යවහාර මුදල් සමඟ යම් රටක ව්‍යවහාර මුදල් හුවමාරු කරගන්නා ක්‍රමවේදය සහ විදේශ විනිමය වෙළෙඳපොළ කළමනාකරණය කරන ආකාරය විනිමය අනුපාතික රජයනය මඟින් විස්තර කෙරෙයි. මෙය බොහෝ විට රටෙහි මුදල් ප්‍රතිපත්තිය සමඟ දැඩි ලෙසින් බැඳී ඇති අතර ඒවා බොහෝ විට පොදු සාධක සමූහයක් මත රඳා පවතී.

විනිමය අනුපාතික රජයනයන්ට නිදසුන් වශයෙන් වෙළෙඳපොළ බලවේග විසින් තීරණය කරනු ලබන පාවෙන විනිමය අනුපාතික ක්‍රමය, මූල්‍ය අධිකාරියේ කළමනාකරණයට යටත් පාලිත පාවෙන විනිමය අනුපාතික ක්‍රමය, වෙනත් රටක ව්‍යවහාර මුදලක් හා ඍජු ව බැඳුණු විනිමය අනුපාතික ක්‍රමය දැක්විය හැකි ය.

## විනිමය අනුපාතිකය නිර්ණය වීම


විනිමය අනුපාතිකය යනු එක් මුදල් ඒකකයක වටිනාකම තවත් මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීමයි. සාමාන්‍යයෙන් විදේශ විනිමය වෙළෙඳපොළේ දී විනිමය අනුපාතය දක්වනුයේ විදේශ මුදල් ඒකකයකට දේශීය මුදල් ඒකක කො පමණ වේ ද යන ආකාරයෙනි.

| | | |
|---|---|---|
| උදා: | ඩොලර් 1 | රුපියල් 118 |
| | ජපන් යෙන් 1 | රුපියල් 1.48 |
| | ස්ටර්ලින් පවුම් 1 | රුපියල් 178 |

විනිමය අනුපාතිකය නිරන්තරයෙන් වෙනස් වන අතර විවිධ මූල්‍ය ප්‍රතිපත්ති යටතේ එය විවිධාකාරයෙන් නිර්ණය වෙයි. ඒ අතරින් වර්තමානයේ පිළිගැනී ඇති සම්මතයන්ට අනුව වඩාත් සුදුසු ම ක්‍රමය වන්නේ විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම සහ සැපයුම මත නිදහස් විනිමය අනුපාතිකය තීරණය වීමයි. එය තීරණය වන ආකාරය පහත ප්‍රස්ථාරයෙන් පැහැදිලි කර ඇත. (ශ්‍රී ලංකා රුපියල හා එක්සත් ජනපද ඩොලරය අතර විනිමය අනුපාතිකය නිර්ණය වන ආකාරය එ මඟින් පැහැදිලි කර ඇත).

**1 වන රූප සටහන**

**ඉල්ලුම හා සැපයුම මත විදේශ විනිමය අනුපාතය තීරණය වන ආකාරය**




භාණ්ඩයකට ඇති ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් විසින් එහි මිල තීරණය වන්නා හා සේ ම, විනිමය අනුපාතය ද තීරණය වෙයි. ඩොලරයකට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය (එ නම්, විනිමය අනුපාතිකය) සහ ඒ සඳහා වන ඉල්ලුම අතර ඇති ප්‍රතිලෝම සම්බන්ධතාව පැහැදිලි කරමින් ඩොලර් ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් ව දක්වා ඇත. තව ද, විනිමය අනුපාතිකය සහ ඩොලර් සැපයුම අතර ඇති අනුලෝම සම්බන්ධතාවය පැහැදිලි කරමින් ඩොලර් සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් ව දක්වා ඇත. මෙම ඉල්ලුම හා සැපයුම සමතුලිත අවස්ථාවේ දී විනිමය අනුපාතිකය ($e_0$) තීරණය වෙයි. එම අවස්ථාවේ දී ඉල්ලුම හා සැපයුම රූප සටහනේ $\$_0$ මඟින් පෙන්නුම් කරයි.

## විනිමය අනුපාතය උච්චාවචනය

විවිධ සාධකවල ශුද්ධ බලපෑම නිසා විදේශ විනිමය සඳහා ඇති ඉල්ලුම ද එහි සැපයුම ද වෙනස් වේ. එ විට විනිමය

අනුපාතිකය ද ඉතා කෙටි කාලයක් තුළ වෙනස්වීම්වලට භාජනය වී පෙර පැවති සමතුලිතතාවයෙන් බාහිර වූ සමතුලිතයක් කරා එළැඹේ. විනිමය අනුපාතික උච්චාවචනය වීම කෙරෙහි බලපාන සාධක කිහිපයක් පහතින් දක්වා ඇත.

### ජාත්‍යන්තර වෙළෙඳාම

විදේශ ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම හා සැපයුම කෙරෙහි බලපාන්නා වූ ප්‍රධාන ම සාධකය වන්නේ රටවල් අතර පවත්නා භාණ්ඩ හා සේවා වෙළෙඳාම ය. අනෙකුත් රටවල ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් ගත් කල රටක ව්‍යවහාර මුදලෙහි අගය හෝ ශක්තිය හෝ දුබලකම හෝ තීරණය වන්නේ එම රට අනෙකුත් රටවල් සමඟ කරන වෙළෙඳාම මත ය. යම් රටක ආනයන ඉහළ මට්ටමක පවතී නම් එම රටෙහි විදේශ ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම ද ඉහළ ය. විදේශ ව්‍යවහාර මුදල් සඳහා ඉහළ ඉල්ලුමක් පැවැතීමෙන් විදේශ ව්‍යවහාර මුදලෙහි දේශීය අගය ඉහළ යන අතර දේශීය ව්‍යවහාර මුදලෙහි අගය පිරිහෙයි. සංවර්ධන උවමනාවන් වෙනුවෙන් ආනයන මත රඳා පවත්නා ඌන සංවර්ධිත රටවල් සඳහා මෙය අනිවාර්යය තත්ත්වයකි. රටක ව්‍යවහාර මුදලෙහි ශක්තිමත් බව සහ දුබල බව එහි ජංගම ගිණුමෙහි ශේෂයෙන් (එ නම්, අතිරික්තයෙන් හෝ හිඟයෙන්) පිළිබිඹු වෙයි.

### ප්‍රාග්ධන සංචලන

වත්මන් ලෝක ආර්ථිකය තුළ විනිමය අනුපාතිකය තීරණය වීම කෙරෙහි බලපාන වඩා වැදගත් සාධකයක් බවට පත් ව ඇත්තේ ඍජු විදේශ ආයෝජනය (FDI - Foreign direct investment) සහ විදේශ ආයතනික ආයෝජනය (FII - Foreign institutional investments) ලෙසින් ගලා එන ජාත්‍යන්තර ආයෝජන ය. විදේශ ආයෝජන ඔස්සේ විශාල වශයෙන් ප්‍රාග්ධනය ආකර්ෂණය කරගන්නා රටවල දේශීය ව්‍යවහාර මුදලට ඇති ඉහළ යෑමට අනුලෝම ව එහි අගය ඉහළ යෑමක් ද දැකගත හැකි ය. එයට ප්‍රතිපක්ෂ ව ප්‍රාග්ධනය පිටතට ගලායෑම් විසින් දේශීය ව්‍යවහාර මුදලෙහි අගය පිරිහීමට ලක් වෙයි.

### මිල විචලනය

විදේශ විනිමය වෙළෙඳපොළෙහි දේශීය ව්‍යවහාර මුදල සඳහා වන ඉල්ලුම සහ සැපයුම කෙරෙහි බලපෑම් ඇති කරන නිසා උද්ධමනය හෝ අවධමනය හෝ විසින් විනිමය අනුපාතිකය තීරණය කරනු ලබයි. නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකාවේ උද්ධමනකාරී වාතාවරණයක් ඇතිවීමෙන් විනිමය අනුපාතිකයට වන බලපෑම සළකා බැලිය හැකි ය. ශ්‍රී ලංකාවේ මිල ගණන් ඉහළ යන විට ඒ හේතුවෙන් ශ්‍රී ලාංකික නිෂ්පාදන මිල අධික ඒවා බවට පත්වෙයි. එම නිෂ්පාදනයන් ගේ මිල ඉල්ලුම් නම්‍යතාව ඉහළ නම් ඒවා සඳහා වන ඉල්ලුම පහළ බසියි. අපනයන පහත වැටෙන විට විදේශ විනිමය ලැබීම් පහළ ගොස් රුපියලෙහි හුවමාරු අගය පිරිහීමට ලක්වෙයි.

### සමපේක්ෂණ

මූල්‍ය වෙළෙඳපොළෙහි සෑම විටෙක ම අවිනිශ්චිතතාව රජ කරයි. ලෝකයේ විවිධ රටවල හටගන්නා වූ විවිධ සිදුවීම් පදනම් කරගෙන සමපේක්ෂකයෝ අනාගත විනිමය අනුපාතික ගැන පුරෝකථනයේ යෙදෙති. රටක සිදුවන විවිධාකාර විචලන සහ ජාත්‍යන්තර විචලනවලට එම රට ඔරොත්තු දෙන ආකාරය පිළිබඳ ව අධ්‍යයන කරන සමපේක්ෂකයෝ එම රටවල ආර්ථික ශක්තීන් හා දුර්වලකම් මත පදනම් වී අනාගත විනිමය අනුපාතික පිළිබඳ පුරෝකථනයන් කරති. නුදුරු අනාගතයේ දී යම් ව්‍යවහාර මුදලක අගය පිරිහෙන බවක් ඔවුන් අපේක්ෂා කරන්නේ නම් එම ව්‍යවහාර මුදල් විකුණා අගය ඉහළ යන බව අපේක්ෂා කරන ව්‍යවහාර මුදල් මිල දී ගැනීමට ඔවුහු පෙළඹෙති. එ ලෙස සමපේක්ෂකයන් විසින් විකුණනු ලබන ව්‍යවහාර මුදල් විදේශ විනිමය වෙළෙඳපොළට එකතුවන නිසා ඒවායේ සැපයුම වැඩි වී එහි මිල තවදුරටත් අවප්‍රමාණය වෙයි. සමපේක්ෂකයන් විසින් මිල දී ගන්නා ව්‍යවහාර මුදල්වලට වන ඉල්ලුම ඉහළ යත් ම ඒවායේ අගය අතිප්‍රමාණය වෙයි.

### ආර්ථිකයේ ශක්තිය

යම් රටක මූලික ආර්ථික නිර්ණායක ශක්තිමත් ව පවතින්නේ නම් එහි දේශීය ව්‍යවහාර මුදල ස්ථාවර ව හා ශක්තිමත් ව පවතී. රාජ්‍ය අය වැය ශේෂය, ජංගම ගිණුමේ ශේෂය, ජාත්‍යන්තර වගකීම්, විදේශ විනිමය සංචිත, ජාත්‍යන්තර වෙළෙඳ විචලන කෙරෙහි දක්වන ප්‍රතිචාර, දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, උද්ධමන අනුපාතිකය ආදිය විසින් ආර්ථිකයක ශක්තිය ගෙනහැර දක්වනු ලබයි.

### රාජ්‍ය ප්‍රතිපත්ති

ස්ථාවර හෝ පාලිත පාවෙන විනිමය අනුපාතික ක්‍රම භාවිතා කෙරෙන රටවල විදේශ විනිමය වෙළෙඳපොළෙහි වැදගත් තීරකයකු බවට මහ බැංකුව පත්වෙයි. සුරැකුම්පත් සහ ව්‍යවහාර මුදල් මිල දී ගැනීම සහ විකිණීම වැනි තම වෙළෙඳපොළ කටයුතු මඟින් මහ බැංකුව ව්‍යවහාර මුදලෙහි අගය කෙරෙහි බලපෑම් එල්ල කරයි. ආයෝජන කෙරෙහි බලපෑම් කිරීමට ද එ මඟින් දේශීය ව්‍යවහාර මුදලෙහි ඉල්ලුම හා සැපයුම වෙනස් කිරීමට ද යොදාගත හැකි බැවින් බැංකු අනුපාතිකවලින් ද විනිමය අනුපාතිකය හැඩ ගැස්විය හැකි ය.

### කොටස් වෙළෙඳපොළ කටයුතු

විදේශ සුරැකුම්, ණයකර, ව්‍යාපාර වස්තු සහ කොටස් හා සම්බන්ධ කොටස් වෙළෙඳපොළ හුවමාරු කටයුතු නිසා ද ඒ

හා බැඳුණු ව්‍යවහාර මුදල්වල ඉල්ලුම හා සැපයුම කෙරෙහි බලපෑම් එල්ල කරන අතර ඒ හේතුවෙන් ඒවායේ විනිමය අනුපාතික විචලනය කරවයි.

**දේශපාලනික කරුණු**

රටක ශක්තිය හා ස්ථාවරත්වය පිළිබඳ ව පරම තීරකයා වන්නේ එහි පවත්නා දේශපාලනික වාතාවරණය ය. ස්ථාවර හා කාර්යක්ෂම රජයක පැවැත්ම විසින් රටක සංවර්ධන ක්‍රියාකාරකම් දිරිගන්වන අතර ඒ මඟින් ආයෝජක විශ්වාසය තහවුරු කර රට පිළිබඳ පිළිගැනීමක් ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඇති කරයි. ශක්තිමත්, ධනාත්මක ප්‍රතිරූපයක් හිමි ආර්ථිකයක් නිසැකයෙන් ම ශක්තිමත් දේශීය ව්‍යවහාර මුදලකට ද හිමිකම් කියයි. අනාගත රජය සහ එම රජයේ ප්‍රතිපත්ති පිළිබඳ ව වන විවිධාකාර පුරෝකථනයන් සමඟින් පාර්ලිමේන්තු මැතිවරණ සමයක දී සමපේක්ෂක ක්‍රියා ඉහළ යන්නේ ද මෙම හේතුව නිසාවෙනි. න්‍යෂ්ටික අත්හදා බැලීම් මුල් කරගෙන ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය විසින් ඉරානයට සම්බාධක පැනවීම තුළින් විදේශ විනිමය වෙළෙඳපොළට එල්ල වී ඇති බලපෑම ද මේ සඳහා උදාහරණයක් වශයෙන් දැක්විය හැකි ය.

**විනිමය අනුපාතය අවප්‍රමාණය වීම හෝ අධිප්‍රමාණය වීම**

විදේශීය මුදල් ඒකකයක් සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ගණන ඉහළයාම විනිමය අනුපාතය අවප්‍රමාණයවීමක් ලෙසත් විදේශීය මුදල් ඒකකයක් සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ගණන පහළ යාම විනිමය අනුපාතය අධිප්‍රමාණය වීමක් ලෙසත් හැඳින්වේ.

උදාහරණයක් ලෙස ඩොලර් 1 ක් රුපියල් 118 සිට 120 දක්වා ඉහළ ගියහොත් රුපියලේ වටිනාකම අඩු වී රුපියල අවප්‍රමාණය වනු ඇත. අනෙක් අතට ඩොලර් 1 ක් රුපියල් 118 සිට 116 දක්වා අඩුවුවහොත් රුපියලේ වටිනාකම ඉහළගොස් රුපියල අධිප්‍රමාණය වනු ඇත.

විචල්‍යතාව අඩුකොට ආර්ථිකයට ගැලපෙන ලෙසින් විනිමය අනුපාත ස්ථායිතාව පවත්වා ගෙන යෑම මහ බැංකුවක අභිප්‍රාය වෙයි. කෙසේ වෙතත්, අහිතකර ගෙවුම් ශේෂ තත්ත්වයන් නිවැරදි කිරීම සඳහා විනිමය අනුපාතය අවප්‍රමාණය කිරීමට හෝ අධිප්‍රමාණය කිරීමට හෝ මහ බැංකුවක් යොමු විය හැකි ය.

විනිමය අනුපාතය අවප්‍රමාණයවීම හෝ අධිප්‍රමාණයවීම කෙරෙහි බලපාන හේතු කිහිපයකි.

**සාපේක්ෂ නිෂ්පාදන මිල**

යම් රටක නිෂ්පාදන සාපේක්ෂ වශයෙන් ලාභදායක නම් විදේශිකයෝ එම නිෂ්පාදන මිල දී ගැනීමට පෙළඹෙති. එම භාණ්ඩ මිල දී ගැනීම සඳහා ඒවා නිෂ්පාදනය කරන රටෙහි දේශීය ව්‍යවහාර මුදල් අවශ්‍ය වේ. එහෙයින් එ කී ව්‍යවහාර මුදල සඳහා ඇති ඉල්ලුම ඉහළ යයි. ප්‍රතිඵලය වන්නේ එම ව්‍යවහාර මුදලෙහි අගය ඉහළ යෑම ය. අඩු ම මිල මට්ටම් ඇති රටවල් ඉතා ශක්තිමත් ව්‍යවහාර මුදල්වලට හිමිකම් කියයි. එම ව්‍යවහාර මුදල් නිරන්තරයෙන් අධිප්‍රමාණය වෙයි.

**මුදල් ප්‍රතිපත්තිය**

ප්‍රසාරණාත්මක (එ නම්, ලිහිල්) මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන රටවල දේශීය මුදල් සැපයුම ඉහළ යන්නේ ය. එහි ප්‍රතිඵලය වන්නේ එම ව්‍යවහාර මුදල අවප්‍රමාණය වීම ය. එයට ප්‍රතිපක්ෂ ව සංකෝචනාත්මක (එ නම්, දැඩි) මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන රටවල දේශීය මුදල් සැපයුම පහළ යන බැවින් එම ව්‍යවහාර මුදල අධිප්‍රමාණය වෙයි. කෙ සේ වෙතත්, විනිමය අනුපාතය සඳහා රටවල් දෙකක ව්‍යවහාර මුදලෙහි අගය බලපාන බැවින් ඒ දෙ රටෙහි ම මුදල් ප්‍රතිපත්තිය ගැන සැළකිලිමත් වීම මෙහි දී වැදගත් වෙයි. යම් රටක් ප්‍රසාරණාත්මක මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සිටින විට එහි වෙළෙඳ හවුල්කාර රටක් එය ඉක්ම වූ මට්ටමකට තම මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කරන්නේ නම් පළමු කී රටෙහි ව්‍යවහාර මුදල් දෙවනුවට කී වෙළෙඳ හවුල්කාර රටෙහි ව්‍යවහාර මුදලට සාපේක්ෂ ව අධිප්‍රමාණය විය යුතු ය.

**උද්ධමන අනුපාතිකයේ වෙනස්කම්**

ව්‍යවහාර මුදලක් අවප්‍රමාණය (හෝ අධිප්‍රමාණය) වීම කෙරෙහි උද්ධමනය (නැතිනම් අවධමනය) ද බලපායි. වෙළෙඳ හවුල්කාර රටක මිල මට්ටම සාපේක්ෂ ව ස්ථාවර ව පවතින විට යම් රටක දේශීය මිල මට්ටම සියයට 40 කින් පමණ ඉහළ ගියේ යැයි සිතමු. එ විට එම රටෙහි නිෂ්පාදන විදේශිකයන් සඳහා මිල අධික වන අතර එහි වැසියෝ සාපේක්ෂ වශයෙන් ලාභදායක විදේශීය භාණ්ඩ මිල දී ගැනීමට පෙළඹෙති. එහි ප්‍රතිඵලයක් වශයෙන් එම රටෙහි ව්‍යවහාර මුදල අවප්‍රමාණය වෙයි. එම රටෙහි උද්ධමන අනුපාතිකය එහි වෙළෙඳ හවුල්කරුවන් ගේ උද්ධමන අනුපාතිකවලට වඩා අඩු නම්, එහි ප්‍රතිඵලය වන්නේ එහි ව්‍යවහාර මුදල අධිප්‍රමාණය වීම ය. මෙ ලෙස විනිමය අනුපාතික ගැලපීම් නිසා සාපේක්ෂ ව ඉහළ උද්ධමනයක් පවතින රටවල් අඩු උද්ධමන අනුපාතික ඇති රටවල් සමඟ වෙළෙඳ සබඳතා පවත්වා ගෙන යෑමට පෙළඹෙති.

**ආදායම් මට්ටමේ වෙනස්කම්**

යම් රටක (උදා: ශ්‍රී ලංකාවේ) ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවකු ගේ (උදා: ඉන්දියාවේ) ආදායම විශාල වශයෙන් ඉහළ ගියේ යැයි සිතමු. එ විට, එම වෙළෙඳ හවුල්කාර රටෙහි (එ නම්, ඉන්දියාවේ) ජනයා විශාල වශයෙන් මිල අධික ආනයනික භාණ්ඩ පාරිභෝජනයට පෙළඹෙති. ඒ හේතුවෙන් පළමු කී

රටෙහි (එ නම්, ශ්‍රී ලංකාවේ) භාණ්ඩ මිල ඉහළ මට්ටමක පැවැතිය ද ඒවා කෙරෙහි ඉල්ලුමක් ඇති වෙයි. ප්‍රතිඵලය වන්නේ ශ්‍රී ලංකා රුපියලට ඇති ඉල්ලුම ඉහළ ගොස් එහි අගය අධිප්‍රමාණය වෙයි.


## විනිමය අනුපාතය අවප්‍රමාණය වීමේ හෝ අධිප්‍රමාණය වීමේ ආර්ථික ප්‍රතිවිපාක

### වෙළෙඳ ශේෂය කෙරෙහි බලපෑම

රටක ව්‍යවහාර මුදල අවප්‍රමාණය වූ විට ආරම්භයේ දී එහි වෙළෙඳ ශේෂය තවදුරටත් අයහපත් විය හැකි ය. මිල අධික ආනයන හා අඩු වටිනාකම්න් යුතු අපනයනවලට අනුරූපී ව ඉහළ යන විදේශ විනිමය අනුපාතිකය විසින් විශාල වෙළෙඳ හිඟයක් හෝ සුළු වෙළෙඳ අතිරික්තයක් හෝ ශේෂ කරනු ඇත. කෙ සේ වුව ද, කාලයත් සමඟ අඩු මිලැති අපනයන නිසා තරඟකාරීත්වය වැඩි වී රටේ අපනයන ඉහළ යෑම ඇරඹෙන්නේ ය. අනෙක් අතට මිල අධික විදේශීය භාණ්ඩ වෙනුවට ලාභදායක දේශීය නිෂ්පාදන මිල දී ගැනීමට දේශීය පාරිභොගිකයෝ පෙළඹෙති. මේ සියල්ලෙහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යවහාර මුදල අවප්‍රමාණය කිරීමට පෙර පැවතුන තත්ත්වයට වඩා යහපත් මට්ටමකට රටෙහි වෙළෙඳ ශේෂය ඉහළ යන අතර එම වර්ධනය යම් කාලයක් දක්වා රඳා පවතී. මූලික පහත වැටීම කෙටි කාලීන නිසා ද පශ්චාත් වර්ධනය දිගු කාලීන නිසා ද එම විචලනය ප්‍රස්ථාර ගත කළ හොත් ලැබෙනු ඇත්තේ ඉංග්‍රීසි J අකුරෙහි හැඩය ඇති නිරූපණයකි. එහෙයින් මෙවැනි අවස්ථාවක් J - වක්‍ර ආවරණයක් (J - Curve Effect) ලෙසින් හැඳින්වේ. (2 වන රූප සටහන බලන්න)

**2 වන රූප සටහන**

J - වක්‍ර ආවරණය




එ සේ වුව ද මුදල් අවප්‍රමාණය කිරීමේ සාර්ථකත්වය රඳා පවතින්නේ මුදල් අවප්‍රමාණය කරන රටේ අපනයන සහ ආනයන මිල ඉල්ලුම් නම්‍යතාව මත ය. උදාහරණයක් ලෙස අවප්‍රමාණය නිසා දේශීය නිෂ්පාදන මිල පහළ ගියත් අපනයන ඉල්ලුම අනම්‍ය නම්, අවප්‍රමාණයෙන් පසුව වුව ද විදේශිකයෝ ඒවා වැඩියෙන් මිල දී ගැනීමට නො පෙළඹෙති. එහෙයින් අපනයන ආදායම අපේක්ෂිත අයුරින් ඉහළ යන්නේ නැත. අනෙක් අතට අවප්‍රමාණය නිසා රටේ ආනයන වියදම් පෙරට වඩා ඉහළ ගිය ද ආනයන සඳහා වන ඉල්ලුම අනම්‍ය වේ නම්, ආනයන වියදම් තවදුරටත් ඉහළ නැංවීමට අවප්‍රමාණය වීම හේතුවෙයි. මෙම තත්ත්වය විසින් රටෙහි වෙළෙඳ ශේෂය තවත් අයහපත් බවට පත්කරයි.

මුදල් අවප්‍රමාණය කර ඇති අවස්ථාවක දී වෙළෙඳ හවුල්කරුවන් එයට ප්‍රතිචාර වශයෙන් තම ව්‍යවහාර මුදලෙහි අගය ද වෙනස් කළහොත්, ආනයන හා අපනයන සඳහා වන ඉල්ලුම නම්‍ය වුව ද එය රටෙහි ආනයන සහ අපනයන කෙරෙහි කිසිදු බලපෑමක් නොදක්වනු ඇත.

### උද්ධමනය කෙරෙහි බලපෑම

මුදල් අවප්‍රමාණය කිරීම නිසා අපනයන ඉල්ලුම ඉහළ ගොස් අපනයන ආදායම් වැඩිවීමත්, ආනයන වියදම දේශීය මුදලින් ඉහළයාම නිසා ආනයන ඉල්ලුම පහළ ගොස් ආනයන වියදම පහළයාමත් සිදුවිය හැකි ය. නමුත් රටක ආර්ථිකය ආනයන භාණ්ඩ හා සේවා රාශියක් මත පදනම් ව ක්‍රියාත්මක වන විට, එ නම් ආනයන සඳහා ඉල්ලුම අනම්‍ය වන විට වියදම ඉහළ ගිය ද පෙර ආනයන කළ ප්‍රමාණය ම ආනයනය කිරීමට එ රටට සිදුවනු ඇත. ඒ හේතුවෙන් ආනයන වියදම ඉහළ ගොස් දේශීය උද්ධමනය ඉහළ යාමකට හේතු වෙයි. ආනයනික අමුද්‍රව්‍ය හා ආයෝජන භාණ්ඩ මත පදනම් වී නිපදවන දේශීය භාණ්ඩ හා සේවා මිල ඉහළ යාමකට ද මෙය හේතු වේ. එ බැවින් එම තත්ත්වය විසින් දේශීය උද්ධමනය තවදුරටත් ඉහළ නංවයි.

### විදේශීය ණය කෙරෙහි බලපෑම

රටක් ලබාගෙන ඇති විදේශීය ණය සහ පොලිය ආපසු ගෙවිය යුත්තේ ණය ලබාදුන් රටෙහි ව්‍යවහාර මුදලිනි. අවප්‍රමාණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය මුදලේ විදේශීය අගය පහළ යන බැවින් වැඩි දේශීය මුදල් ප්‍රමාණයක් විදේශීය ණය සහ පොලී ගෙවීම වෙනුවෙන් යෙදවීමට සිදු වේ. එය රටෙහි ණය සේවාකරණ පිරිවැය තවදුරටත් වැඩිවීමට හේතු වේ.

### අයවැය කෙරෙහි බලපෑම

මුදලේ අගය අවප්‍රමාණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ණය බර ඉහළ ගිය විට රාජ්‍ය වියදම් ඉහළ යයි. ඒ හේතුවෙන් අයවැය හිඟයක් ද ජනිත විය හැකි ය. නැතහොත් පවත්නා අයවැය හිඟ තත්ත්වයක් තවදුරටත් ඉහළ යා හැකි ය. එ ලෙස වැඩිවන වැය හෝ අයවැය හිඟය හෝ පියවීම සඳහා බදු ඉහළ නැංවීමට රජයට සිදු වේ. එය ජනතාව මත පීඩනය වැඩිකරන්නකි.

**විදේශීය ප්‍රේෂණ, සංචාරක ආදායම් සහ විදේශීය සෘජු ආයෝජන කෙරෙහි බලපෑම**

මුදලේ අගය අවප්‍රමාණයවීම විදේශීය ප්‍රේෂණ වැඩිවීමකට හේතු වේ. දේශීය මුදලේ විදේශීය අගය පහළ යන නිසා සංචාරක පැමිණීම් ඉහළ යාමටත්, ඒ හේතුවෙන් සංචාරක ආදායම වැඩිවීමකටත් හේතුවන අතර විදේශීය සෘජු ආයෝජන ඉහළ යාමකට ද හේතුවේ.

දේශීය මුදලේ අගය ප්‍රතිප්‍රමාණය වීමේ දී මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් දක්නට ලැබේ.

එ නම්,

1. අපනයන සඳහා වන ඉල්ලුම පහළයාම නිසා අපනයන ආදායම පහළ යයි. එය අපනයන කර්මාන්ත අධෛර්යමත්වීමට හේතුවෙයි. අනෙක් අතට අධිප්‍රමාණයේ බලපෑමෙන් ආනයන වියදම අඩුවන බැවින් ආනයන තරඟකාරීත්වය වැඩි වී ආනයන ඉල්ලුම ඉහළ යයි. එය ආනයන ආදේශන කර්මාන්ත කෙරෙහි අහිතකර ලෙස බලපායි.

2. මුදලේ අගය අධිප්‍රමාණය වීම නිසා ආනයන වියදම පහළ යන අතර රට තුළ දේශීය මිල ගණන් ද පහළ යයි. එය උද්ධමනය පහළ යාමට ද හේතු වේ. ඒ සමඟ ආනයනික ආයෝජන භාණ්ඩ සහ අමුද්‍රව්‍ය මිල ද පහළ යන නිසා ඒවා යොදා නිපදවන නිෂ්පාදනයන්හි මිල ද පහළ යයි. එය දේශීය නිෂ්පාදකයන් රැකගැන්මට හේතු වෙයි.

3. විදේශීය ණය බර දේශීය මුදලින් පහළ යාම නිසා මුදල් අවප්‍රමාණය වීම අයවැය මත ඇතිකරන පීඩනය ද පහළ දමයි.

රටක මහ බැංකුව විසින් ආර්ථිකයේ පවතින අවශ්‍යතාවන්ට සහ ප්‍රමුඛතාවන්ට අනුව විනිමය අනුපාතිකයේ හැසිරවීම සිදුකරන අතර ඒ යටතේ විනිමය අනුපාතය අවප්‍රමාණය කිරීම හෝ අධිප්‍රමාණය කිරීම කරනු ලැබේ.

**නිගමනය**

උක්ත කාරණා සියල්ල සැළකූ විට පැහැදිළි වනුයේ වර්තමාන ලෝක ආර්ථික රටාව තුළ විදේශ විනිමය වෙළෙඳපොළට හිමි ව ඇති වැදගත්කම ය. විදේශ විනිමය අනුපාතිකයේ හැසිරීම විසින් රටක ආර්ථික ශක්තියේ ස්වභාවය පෙන්නුම් කෙරෙයි. විදේශ විනිමය අනුපාතිකය යනු හුදෙක් ආර්ථික සාධක මත පමණක් ම තීරණය වන්නක් ද නො වේ. රටක දේශපාලනික ස්ථාවර බව විසින් ද විදේශ විනිමය අනුපාතිකයේ ශක්තිය තීරණය කරනු ලබයි. කෙ සේ වුව ද, විදේශ අනුපාතිකයේ හැසිරීම සම්බන්ධයෙන් දැඩි අවධානයකින් පසුවීම රටක ආර්ථික ස්ථාවරත්වය හා ප්‍රගතිය සාක්ෂාත් කරගැනීමෙහි ලා ඉතා වැදගත් වෙයි.✪

# විනිමය බිල්පතේ උපත

**මාලවිකා ආරියරත්න**

සන්නිවේදන දෙපාර්තමේන්තුව



**ක්‍රිස්තු වර්ෂ 221 - 265 කාලයේ දී චීනයේ භාවිතා වූ කාසියක්**

ඈත අතීතයේ පටන් ම චීන වැසියන් තමන් ගේ කාලයෙන් වැඩිපුර කොටසක් වැය කළේ ගොවිතැන් කටයුතු සඳහායි. චීනයේ උතුරු ප්‍රදේශයේ ගොවියෝ තිරිඟු ද දකුණු ප්‍රදේශයේ ගොවියෝ වී ද වගා කළහ. එයට අමතර ව, ඔවුහු වෙළෙඳ කටයුතුවල ද නිරත වූහ. ඒ වෙළෙඳ කටයුතු රට තුළ මෙන් ම අන් රටවලට ද පැතිර තිබිණි. සේද මාවත විවෘත වීමත් සමඟ චීනයත් යුරෝපයත් අතර වෙළෙඳාම දියුණුවෙන් දියුණුවට පත් විය. එයට අමතර ව, මුහුදු සේද මාවත ඔස්සේ ආසියාවට ද එයිනුත් නො නැවතී අප්‍රිකාවට ද එම වෙළෙඳ කටයුතු ව්‍යාප්ත විය. සේද, පෝසිලේන් වැනි නිෂ්පාදන විකුණු චීන වෙළෙන්දෝ එයට හුවමාරු වශයෙන් රන්, රිදී ඇතුළු දේ ලබාගත්හ.

අට වන සියවස ඇරඹෙන විට චීනයේ වෙළෙඳ කටයුතු ඉතා ඉහළ මට්ටමකට වර්ධනය වී තිබූ අතර එයට පහසුකම් සැපයීමේ මුදල් ක්‍රමයක් ද වර්ධනය වන්නට විය. අලුතින් වෙළෙඳසැල් විවෘත වන්නට විය. වෘත්තීය වෙළෙන්දෝ ද බිහි වූහ. එ ලෙස ම උකස් ගන්නා මධ්‍යස්ථාන ද ඇති විය. ඒවා අය කළ පොලිය ඉතා අධික විය. කෙ සේ වුව ද, මුදල් භාවිතය සම්බන්ධයෙන් ගැටලු ගණනාවක් ම ඉස්මතු ව තිබිණි. එක් ගැටලුවක් වූයේ එ වැනි ආර්ථික වාතාවරණයකට ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් සංසරණයේ පවත්වා ගත යුතු වීම ය. ඉතා විශාල මුදල් ප්‍රමාණයක් එහා මෙහා ගෙන යෑමේ දී ඇති වූ අපහසුතාව තවත් ගැටලුවක් විය. ඒ වනවිට මුදල් වශයෙන් භාවිතා කෙරුණේ තඹ කාසි ය. චීනයේ කාසි සකසා තිබුණේ මැදින් සිදුරක් තිබෙන ආකාරයෙනි. ඒ සිදුර තුළින් යැවූ හුයක ඇමුණු කාසි ගනුදෙනු සඳහා යොදා ගනු ලැබී ය. විශාල ප්‍රමාණයේ ගනුදෙනු සඳහා එවැනි කාසි ඇමිණුම් විශාල වශයෙන් යොදා ගැනීමට සිදු විය. රන් හෝ රිදී වැනි වටිනාකමින් වැඩි ද්‍රව්‍යයක් යොදාගැනීමෙන් එම ගැටලුවට යම් ආකාරයක විසඳුමක් සොයාගත හැකි ය. එහෙත්, චීනයේ තඹ කාසි වෙනුවට රන්, රිදී කාසි භාවිතයක් නො කළ නිසා වෙනත් විකල්පයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු විය. තඹ කාසිවලට ආදේශකයක් වශයෙන් නෝට්ටු මුදල් හඳුන්වා දීමට චීන ජාතිකයන් යොමු වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

චීනයේ තේ වගාවේ ඇති වූ ශීඝ්‍ර වර්ධනය නිසා ද මුදල් එහා මෙහා ගෙන යෑමේ අපහසුතාව වඩාත් හොඳින් දැනෙන්නට විය. චීනයේ උතුරු පළාතින් තේ සඳහා විශාල ඉල්ලුමක් ඇති වූ නිසා අනෙක් ප්‍රදේශවල සිටි තේ වෙළෙන්දෝ එම පළාතට තේ අලෙවි කිරීමට කටයුතු කළහ. එයින් ලැබුණු ලාභය තම ගම්බිම්වලට යැවීමේ දී වෙළෙන්දන්ට ගැටලු ඇති විය. මෙම වකවානුවේ දී චීනයේ ග්‍රාමීය ප්‍රදේශවල සිටි පරිපාලන නියෝජිතයෝ තමන් එක් රැස් කොට ගත් බදු මුදල් අගනුවරට යැවීමට බැඳී සිටියහ. මේ කාර්යය සඳහා පළාත් පරිපාලන ආයතන විසින් එම බදු මුදල් එක් රැස් කොට අගනුවර පිහිටි මූල්‍ය දෙපාර්තමේන්තුවට යැවීම පිණිස තමන්ගේ නියෝජිත ආයතන පිහිටුවා තිබිණ. 8 වන සියවස අග භාගය වන විට මෙම නියෝජිත ආයතන තමන් ගේ සේවය තේ වෙළෙන්දන් වෙතට ද ලබා දුන්නේ ය. එ තැන් පටන් තේ අලෙවියෙන් ලාභ ලැබූ වෙළෙන්දෝ තමන්ගේ මුදල් මෙම ආයතනවලට බාර දුන්හ. ඔවුන්ට ඒ හා සමාන මුදලක් තම පළාතේ පිහිටි පරිපාලන නියෝජිතයින්ගෙන් ලබා ගත හැකි විය. වෙළෙන්දන් තම මුදල් නියෝජිත ආයතනවලට බාර දුන් විට ඔවුනට විශේෂිත ලේඛනයක් එම නියෝජිත ආයතනවලින් ලබා දුණි. එම ලේඛනය ෆෙයි-ෂියාන් (Fei-Qian) නම් විය. එහි තේරුම පියාඹන මුදල් යන්නයි. එම ලේඛනය එ සේ හැඳින්වූයේ ඉතා විශාල මුදලක් පහසුවෙන් ඉතා දුර වේගවත් ගමනක යෙදුන බැවිනි. මේ නිසා වෙළෙන්දන්ට ද පහසුවෙන් ආරක්ෂිත ව චීනය පුරා ගමන් කළ හැකි විය. ෆෙයි-ෂියාන් ලේඛනය මුදල් කුවිතාන්සියක් ලෙස ඉදිරිපත් කළ හැකි විය. ලෝකයේ මුල් ම ගනුදෙනු කළ හැකි ලියවිල්ල ලෙස සැලකෙන්නේ චීනයේ පැවැති මෙම ෆෙයි-ෂියාන් ලේඛනයයි.

ගනුදෙනු කළ හැකි ලියවිල්ලක් යනු විශේෂයෙන් සදහන් කළ පුද්ගලයකුට හෝ බලය ලත් පුද්ගලයකුට නිශ්චිත මුදලක් ගෙවීමට පොරොන්දු වූ අත්සන් කළ ලේඛනයකි. මෙහි ධාරකයා එ නම් මුදල ලබා ගන්නා පුද්ගලයා නම් කළ යුතු ය. එ සේ නැතහොත් ලියවිල්ලෙහි සඳහන් කළ යුතු ය. මෙ වැනි ලියවිල්ලක් අන් අයෙකුට පැවරිය හැක. එ සේ ම මෙම ලේඛනයෙන් ධාරකයා ඉල්ලූ විට දී හෝ නියමිත දිනයක දී නිශ්චිත මුදල් ප්‍රමාණයක් ගෙවීමට පොරොන්දු වේ.

පසු කාලයක දී අරාබි වෙළෙන්දෝ ද ෆෙයි-ෂියාන් හා සමාන ලේඛන මුදල් හුවමාරුව සඳහා භාවිතා කළ හ. ඒවා සුෆ්තාජා (Suftajah) සහ හවාලා (Hawala) නම් විය. මේවා විනිමය බිල්පත් (Bill of Exchange) ගණයට අයත් වේ. විනිමය බිල්පතක් යනු නිශ්චිත මුදල් ප්‍රමාණයක් ඉල්ලූ විට හෝ නිශ්චිත කාලයක දී එක් පුද්ගලයකු ඔහු විසින් නම් කරන ලද විශේෂිත පුද්ගලයකුට හෝ ධාරකයාට ගෙවන ලෙස අණ කරමින් තමන් ගේ අත්සන ද සහිත ව දෙනු ලබන කොන්දේසි රහිත ලිඛිත නියෝගයකි.



සුං රාජ යුගයේ දී (ක්‍රිස්තු වර්ෂ 960 - 1279) චීනයේ භාවිතා කළ මුදල් නෝට්ටුවක්

අරාබි රටවල ද බැංකු කටයුතු ශීඝ්‍රයෙන් වර්ධනය විය. එක් රටක් වෙනත් රටකින් තමන් ලබා ගත් භාණ්ඩ සහ සේවා සඳහා විශාල මුදලක් ගෙවිය යුතු විය. එම මුදල් අවදානමකින් තොර ව දුරු රටවලට ගෙනියන ලද්දේ සුෆ්තාජාවලිනි. අරාබි රටවල් විවිධ මූල්‍ය සහ වාණිජමය කටයුතුවල දී සුෆ්තාජා පුළුල් ව භාවිතා කළේ ය. ඒ නිසා විශාල මුදලක් එහා මෙහා ගෙන යෑමේ දී ඇති වන අවදානම මෙන් ම මුදල් අපනයනයේ දී සහ ආනයනයේ දී ගෙවිය යුතු තීරු බදු ද මග හැරිය හැකි විය. සුෆ්තාජා නිකුත් කිරීම සඳහා කොමිස් මුදලක් අය කර ගනු ලැබී ය.

සුෆ්තාජා සංකල්පයේ උත්පත්තිය සළකා බැලීමේ දී, එය පර්සියානු වචන දෙකකින් බිඳී එන්නක් බව පැහැදිලි වේ. “Suftah” යනු වෙනත් නගරයක හෝ රටක සිටින පුද්ගලයකු තවත් පුද්ගලයකු සමග හුවමාරු කර ගන්නා යම් කිසි භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයකි. “Saftah” යනු වෙනත් ස්ථානයක දී ආපසු ගෙවීමේ පොරොන්දුව මත එක් පුද්ගලයකු තවත් පුද්ගලයකුගෙන් ණයට ලබා ගන්නා යම් කිසි භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයකි. ඒ අනුව සුෆ්තාජා සංකල්පය අරාබි ශබ්දකෝෂවල සඳහන් වන්නේ වෙනත් ස්ථානයක දී ආපසු ගෙවීමේ කොන්දේසිය මත තවත් පුද්ගලයකුට මුදල් හෝ දේපළ පවරා දීම ලෙස ය. ආරක්ෂිත ලෙස මෙම මුදල් හෝ දේපළ පවරා දීම මෙහි විශේෂත්වයයි. මුදල් ප්‍රවාහනයේ දී ඇති වන අවදානම මග හරිනු පිණිස තුන්වන පාර්ශ්වයකට මුදල් ගෙවීමට කරනු ලබන නියෝගයක් සහිත ව වෙනත් නගරයක සිටින තමන් ගේ නියෝජිතයකුට මුදල් හිමිකරු විසින් ලියන ලද ලිපියක් වශයෙන් ද ඇතැම් ශබ්දකෝෂවල මෙම වචනය අර්ථ දැක්වේ. පසු කලෙක දී සුෆ්තාජා සංකල්පය අරාබි භාෂාවෙන් ක්‍රම ක්‍රමයෙන් ඉවත් කොට ඒ වෙනුවට හවාලා සංකල්පය බොහෝ විට භාවිතා කළේ ය.

අරාබි භාෂාවේ හවාලා යන්නට අරුත් දෙකක් ඇත. විශ්වාසය සහ හුවමාරුව එම අරුත් දෙකයි. හවාලා ජාලය අවිධිමත් මූල්‍ය පද්ධතියකි. එහි හවුල්කරුවන්ට ලාභදායී සහ කාර්යක්ෂම ලෙස මෙන් ම දේශීය ව සහ විදේශීය ව ද පහසුවෙන් මෙම පද්ධතිය හරහා මුදල් හුවමාරු කළ හැක.

බැංකු ඇතිවීමටත් පෙර මුදල් හුවමාරු කිරීමේ ක්‍රමයක් ලෙස හවාලා පද්ධතිය බිහි විය. මෙම පද්ධතියේ උත්පත්තිය පිළිබඳ ව මත දෙකක් පවතී. මුල් මතය වන්නේ එකිනෙකා ගේ ගිණුම් පියවා ගැනීමට අග්නිදිග ආසියානුවන් සහ අප්‍රිකාවේ සිටින සංක්‍රමණික අග්නිදිග ආසියානුවන් සඳහා උපක්‍රමයක් ලෙස හවාලා පද්ධතිය ඇති වූ බවයි. මහ මග සිදු වන මංකොල්ලකෑම්වලින් ආරක්ෂාවීමට අරාබි වෙළෙන්දන්ට ඇති වූ අවශ්‍යතාව මෙයට හේතු වූ බව දෙවන මතයයි.

හවාලා පද්ධතියේ මුල් ම අරමුණ වූයේ මුහුදු ගමනක දී හෝ ඔටුවකු පිට යන ගමනක දී වැනි දුරස්ථ ව සිදු වන වෙළෙඳාම්වලට පහසුකම් සැලසීමයි. මෙම වෙළෙඳාම්වල දී මුහුණ පෑ ප්‍රධාන ම ගැටලුව වූයේ මූල්‍යමය සුරක්ෂිතභාවයයි. මෙහි දී මුහුදු කොල්ලකරුවන්ගෙන් සහ මංකොල්ලකරුවන්ගෙන් තමන් ගේ භාණ්ඩ ආරක්ෂා කර ගැනීම පමණක් නො ව ඈත පිහිටි වෙළෙඳපොළකින් තමන්ට වුවමනා බඩු ලබා ගැනීමට අවශ්‍ය කරන රන් හා රිදී ආරක්ෂා කර ගැනීම ද ගැටලුවක් විය. මෙම අභියෝගවලට මුහුණ දීමට ඇති වුණු හවාලා පද්ධතිය විශ්වාසවන්ත සහ කාර්යක්ෂම විය යුතු විය. එ පමණක් නො ව ඉස්ලාම් නීතියේ මූලධර්මවලට ද අනුකූල විය යුතු විය.

දුරකථන හෝ විදුලි පණිවිඩ නොමැති වූ යුගයේ දී එකිනෙකට දුරස් පෙදෙස් අතර සිදු වූ තොරතුරු හුවමාරුව ද ඉතාමත් මන්දගාමී විය. දුරස්ථ වෙළෙඳාම කාර්යක්ෂම ව සහ ආරක්ෂිත ව කරගෙන යෑමට නම් විශ්වාසවන්තභාවය ඉහළින් ම තිබිය යුතු බව පිළිගැනිණි. මේ නිසා හවාලා පද්ධතියට සම්බන්ධ සියළු ම දෙනා එකිනෙකා කෙරෙහි ඉතා තද විශ්වාසයක් ගොඩ නගා ගත යුතු විය. මේ හේතුවෙන් බොහෝ විට මෙම පද්ධතියට සම්බන්ධ වූයේ සමීපත ම සබඳතා ඇති අයයි.

මෙ වැනි ජාලයක් තුළ පිටතින් පැමිණෙන වෙළෙන්දෙකුට හවාලා පද්ධතියකට අයත් ඕනෑ ම මධ්‍යස්ථානයක මුදල්

තැන්පත් කළ හැක. එම ස්ථානයේ භාරකරු ණය බාර ගත් බවට තැන්පත්කරුට බිල්පතක් ඉදිරිපත් කරයි. හවාලා පද්ධතියට සම්බන්ධ වෙනත් දුරස්ථ ව පිහිටි වෙළෙඳ මධ්‍යස්ථායකින් එම බිල්පත ඉදිරිපත් කර ඉල්ලූ විටක දී හෝ අනාගතයේ නියම කර ගත් දිනක දී මුදල් බවට හරවා ගත හැක.

අතීතයේ දී විනිමය බිල්පත් භාවිතා කළ බවට තොරතුරු ප්‍රංශයෙන් ද වාර්තා වේ. ප්‍රංශයේ දෙවන පිලිප් රජු ඔහු ගේ රාජධානියෙන් යුදෙව්වන් පිටුවහල් කිරීමේ ආඥාවක් ක්‍රිස්තු වර්ෂ 1181 දී නිකුත් කළේ ය. ප්‍රංශයේ පැවැති ඔවුන ගේ කටයුතු එකලසක් කර ගැනීම සඳහා මාස තුනක කාලයක් ඔවුනට ලබා දුනි. නිශ්චල දේපල රාජසන්තක කෙරුනි. එ සේ වුව ද ඔවුන ගේ මුදල් සහ වෙනත් පෞද්ගලික දේපල ළඟ තබා ගැනීමට අවසර ලැබුනි. යුරෝපයේ බොහෝ රටවල මෙන් ඒ කාලයේ දී ප්‍රංශයේ ද රාජධානියෙන් පිටතට මුදල් ගෙනයෑම හෝ යැවීම නීතියෙන් තහනම් විය. ඉතාලියේ ලොම්බාඩි (Lombardy) ප්‍රදේශයට යුදෙව්වෝ පලා ගියහ. ප්‍රංශයෙන් පලා යෑමට පෙර ඔවුහු දේපල විකුණුහ. ඒ සඳහා ද ඔවුනට අවසර ලැබුනි. විකිණීමෙන් ලත් මුදලින් ඔවුන ගේ ගමනට අවශ්‍ය මුදල තමන් ළඟ තබා ගනිමින් ඉතිරි මුදල් මිතුරන් ගේ භාරයේ තබන ලදී. ඒ සඳහා යුදෙව්වන්ට බිල්පතක් ලැබුනි. ඔවුන් ලොම්බාඩි ප්‍රදේශයේ නගරවල ස්ථිර ලෙස පදිංචි වූවාට පසු ව ප්‍රංශයේ ගනුදෙනු කරනු ලබන ලොම්බාඩ්වරුන්ට (එ නම්, ලොම්බාඩි ප්‍රදේශයේ පාරම්පරික ව සිටි වෙළෙන්දන්ට) මෙම බිල්පත් අලෙවි කරන ලදී. මේවා අතීතයේ සිට පැවත ආ විනිමය බිල්පත් වර්ගයක් ලෙස ද සැළකේ.

ඉතාලියේ ජිනෝවා (Genoa), ෆ්ලොරන්ස් (Florence), වැනීසිය (Venice) වැනි නගරවල වෙළෙන්දෝ ඔවුන ගේ භාණ්ඩ රැගත් නෞකාවලින් නැගෙනහිර බලා යාත්‍රා කළහ. ඒ භාණ්ඩ සඳහා ඔවුනට රන් හා රිදී කාසි ලැබුනි. වෙළෙන්දෝ එයින් ලැබුණු ඔවුන ගේ ධනයෙන් අතිරික්තය රජයේ භාණ්ඩාගාරවල තැන්පත් කොට තැන්පත් මුදලේ වටිනාකම සඳහන් හුවමාරු ලිපි ලබා ගත්හ. රටෙහි වෙළෙඳාම ඉහළ යන විට විවිධ නගර අතර අලෙවි වුණු භාණ්ඩ සඳහා කරනු ලැබූ ගෙවීම්වලට පහසුකම් සැලසීමට ණයවර ලිපි අවශ්‍ය විය. එම නිසා ගනුදෙනු කළ හැකි ලියවිලි මේ කාර්යය සඳහා දායක විය. මෙය බැංකු ක්‍රියාකාරකම්වල ප්‍රගතියක් ලෙස එ කල සැළකුනි.

මෙම ඉතාලි නගරවල බැංකු මගින් කාර්යයන් දෙකක් සිදු කරන ලදී. එක් කාර්යයක් වූයේ මුදල් මාරුකිරීම, තැන්පතු භාරගැනීම සහ ගිණුම් අතර මුදල් හුවමාරු කිරීමයි. ණය දීම සහ බිල්පත් වට්ටම් කිරීම දෙවන කාර්යය විය. පළමු කාර්යයේ දී නගර සහා මගින් බැංකු කටයුතු සිදු කළහ. යුදෙව්වෝ හෝ ලොම්බාඩ්වරු දෙවන කාර්යයේ දී ණය දෙන්නෝ බවට පත් වූහ. බිල්පත් භාවිතය මූලික ව ම පැවතියේ යුදෙව්වන් ගේ අතෙහි ය. ඔවුන් ගේ ධනය එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට රැගෙන යෑමේ දී මෙම ලියවිලි ඉතා වාසිදායක විය. විවිධ රටවලින් යුදෙව්වන් නිරන්තරයෙන් පිටුවහල් කළ බැවින් මේවා නිතර අවශ්‍ය විය. තවත් අමතක නො කළ යුතු කාරණයක් ද විය. එ නම් රෝමානු පල්ලියට තිබුණු මහා බලයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම බිල්පත් මිනිසුන් අතර සංසරණය වීම ඉහළ යාමයි. එයට හේතුව වූයේ සෑම රටක් ම පාප්වහන්සේට යම් කිසි මුදල් ප්‍රමාණයකින් ආධාර කළ යුතු වීමයි. රන් කාසි හෝ විනිමය බිල්පත් මාර්ගයෙන් මෙම ප්‍රේෂණ ගෙවනු ලැබී ය.

ණයවර ලිපිවල වර්ධනය ලොම්බාඩ්වරු නිසා සිදු විය. රෝම අධිරාජ්‍යයේ වැටීමෙන් පසු මෙම ලොම්බාඩ්වරු ඉතාලියේ පදිංචි වූහ. පසු ව මොවුහු ලන්ඩන් නුවර වාසස්ථාන ඇති කර ගත්හ. එ සේ වුව ද යුදෙව්වන් ණය දෙන්නන් ලෙස ස්ථාපිත වී සිටි නිසා ලොම්බාර්ඩ්වරු එම කාර්යයෙන් ඈත් වී සිටියහ. එහෙත් ලන්ඩන් නුවරින් යුදෙව්වන් පිටුවහල් කරනු ලැබූ විට ණය දෙන්නෝ බවට ලොම්බාර්ඩ්වරු පත් වූහ. මේ වන විට ලබා දුන් ණය සඳහා පොලියක් අය කිරීම පිළිබඳ ව ද සමාජය අතර යහපත් මතයක් ගොඩ නැගෙමින් පැවතින.



**ජිනෝවා බැංකුකරුවෝ**

1307 දී එංගලන්තයේ පළමු වරට බිල්පත් භාවිතා වූ බව කියනු ලැබේ. එ සේ ම එය එංගලන්තයේ සිට වෙනත් රටවලට මුදල් යැවීමේ නීතිමය මාර්ගයක් ලෙසට ද පිළිගැණිනි.

එම නිසා බිල්පත් පිළිබඳ ඉතිහාසයෙන් පෙනෙන්නේ ඒවා මූලික ව ම යොදා ගනු ලැබූයේ මුදල් එහා මෙහා ගෙන යෑම සඳහා බව ය. එ සේ වුව ද වැටුප් ගෙවීම සහ එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට ණය ගෙවීම සඳහා ද මේවා භාවිතා කර ඇත. 17 සහ 18 වන ශත වර්ෂ වන විට බැංකු කිහිපයක් පිහිටුවා තිබුණ ද බැංකු කටයුතු පිළිබඳ දැනීමක් මිනිසුන් අතර නො වී ය. මෙම පෞද්ගලික බැංකුකරුවෝ නෝට්ටු නිකුත් කළහ. එහෙත් ජනගහනයත් සමග සැසඳීමේ දී සංසරණයේ පැවතියේ ඉතා සුළු බිල්පත් ප්‍රමාණයකි. මේ නිසා බැංකු නෝට්ටු වෙනුවෙන් සහ වැටුප් ගෙවීම වෙනුවෙන් මෙම බිල්පත් භාවිතය සීමා විය.

මධ්‍යතන යුගයේ යුරෝපීය වෙළෙඳාමේ ප්‍රධාන භූමිකාව රඟ දක්වන ලද්දේ ඉතාලි වෙළෙන්දන් සහ බැංකුකරුවන් විසිනි. එහෙත් යුරෝපයේ ප්‍රධාන වෙළෙඳ මාර්ග වැටී තිබුණේ ප්‍රංශය ඔස්සේ ය. එම නිසා ඉතාලියට අයත් විනිමය බිල්පත් බෙදාහැරීම ප්‍රංශයේ ෂැම්පේන් (Champagne) සහ ලියෝන් (Lyon) වෙළෙඳපොළ මගින් වර්ධනය විය. කෙ සේ වෙතත්, මෙම ඉතාලියට අයත් බිල්පත් වෙළෙඳපොළේ දී නව මුහුණුවරක් ගත්තේ ය. වෙළෙඳපොළෙහි බිල්පත් බහුල විය. බැංකුකරුවන් හමුවීමට මිස වෙළෙඳාම සඳහා වෙළෙඳපොළ ක්‍රියා නො කරන්නේ යැ යි චෝදනා ද ලැබී ය.

**ප්‍රතිග්‍රහණය**

විනිමය බිල්පතකට පාර්ශ්ව කිහිපයකගේ සහභාගිත්වය අවශ්‍ය වේ. අණකරු (Drawer) එක් පාර්ශ්වයකි. වෙළෙඳ ගනුදෙනුවක දී විනිමය බිල්පත නිකුත් කරනු ලබන්නේ අණකරුයි. එ සේ ම වෙළෙඳ ගනුදෙනුවක දී ගෙවීම හෝ ප්‍රතිග්‍රහණය කිරීම සඳහා විනිමය බිල්පත ලබන්නා අණලද්දා (Drawee) වේ. බිල්පතක් ප්‍රතිග්‍රහණය කිරීම යනු බිල්පතක් භාරගෙන එයට ගෙවීමක් සිදු කිරීමට අණලද්දා විසින් පිළිගැනීමයි. තුන් වන පාර්ශ්වය වන ආදායක (Payee) බිල්පතට ගෙවීමක් ලබන තැනැත්තායි.

මුල් කාලයේ දී වෙළෙඳපොළේ දී බිල්පත ප්‍රතිග්‍රහණය කිරීම ප්‍රකාශයට පත් විය. එ නම්, ගෙවීම සිදු කිරීම සඳහා බිල්පත පිළිගැනීමට ගෙවන්නා (Payer) තුළ ඇති කැමැත්ත වෙළෙන්දන් සහ බැංකුකරුවන් සහභාගී වන රැස්වීමක දී ගෙවන්නා විසින් ප්‍රසිද්ධියට පත් කිරීමේ චාරිත්‍රයක් පැවතින. බිල්පත දරන්නාට භාණ්ඩ මිල දී ගැනීම පිළිබඳ ව සැලසුම් කළ හැකි වූයේ ඉන් පසුවයි. මේ සඳහා විශේෂ ලේඛනයක් පිළියෙළ විය. පසු ව මෙම ක්‍රියාව අත්හැර දමා ගෙවීමට ඔහු ගේ කැමැත්ත ප්‍රකාශ කරමින් බිල්පතේ කෙටි සටහනක් තැබීම ආරම්භ විය. සාක්ෂිකරුවන් සිටින අවස්ථාවක දී ප්‍රතිග්‍රහණය කිරීම වාචික ව කළ හැකි විය. මෙම ක්‍රියාවලිය පහසු කරලීම සඳහා විශාල වෙළෙඳපොළවල දී යම්කිසි වෙළෙඳපොළක දී ප්‍රතිග්‍රහණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන බිල්පත් ලැයිස්තුගත කෙරින. වෙළෙඳපොළ විවෘත කළ විගස ම ප්‍රතිග්‍රහණය කළ බිල්පත් සඳහා පිළිගත් බවට සඳහනක් කළේ ය.

බිල්පත් ලිඛිත ව ප්‍රතිග්‍රහණය කිරීමේ ක්‍රමය ආරම්භ වූයේ 1667 දී ය. බිල්පත්වල ක්‍රියාකාරකම් සටහන් කර ගැනීම සඳහා වෙළෙන්දෝ සහ බැංකුකරුවෝ විශේෂ පොත් භාවිතා කළහ. අණකරුවන් විසින් ඔවුන් ගේ නමට නිකුත් කරන ලද සහ ඔවුන්ට ඉදිරිපත් කරන ලද සියළු ම බිල්පත් පිළිබඳ තොරතුරු එම පොත්වල ඔවුහු වාර්තා කළහ. ඔවුහු බිල්පතක් ප්‍රතිග්‍රහණය කළ හොත් එම සටහන ඉදිරියෙන් කතිරයක් සළකුණු කළහ. බිල්පතක් පිළිබඳ ව සැකයක් මතු වුව හොත් හෝ ප්‍රතිග්‍රහණය කිරීම පිළිබඳ ව සළකා බැලීමට සිදු වුව හොත් පොතෙහි අදාළ වාර්තාව ඉදිරියෙන් 'V' අක්ෂරය සටහන් කළේ ය. බිල්පතක් පිළි නො ගත හොත් ඒ සඳහා 'SP' අක්ෂර යෙදුවේ ය. දරන්නෙකුට බිල්පතක් සඳහා විරෝධය පෑමට අවශ්‍ය වූයේ නම් වෙළෙඳාම අවසන් වී දින තුනකට පසු ඒ බිල්පත පිළිබඳ ව විරෝධය පෑ යුතු විය.

බිල්පතක් ප්‍රතිග්‍රහණය කිරීමට අණලද්දෙකු එකඟ නො වූ අවස්ථාවක දී හෝ බිල්පත් බේරුම් කරන ස්ථානයේ අණලද්දා නො සිටීම වැනි වෙනත් හේතු නිසා එය පිළි නො ගත හොත් තුන් වන පාර්ශ්වය ලෙස අතරමැදියකුට එය පිළිගැනීමට අවසර ලැබුනි. බිල්පතෙහි සඳහන් කර නො මැති අවසර නො ලත් පුද්ගලයකු ලෙස සහ අණලද්දා හෝ නියෝජිතයකු ලෙස එය සිදු කළ හැකි විය.



වැනීසියේ යුදෙව්වෝ

බිල්පත් බේරුම් කර ගත හැකි ස්ථාන බිහි වීම සියළු ම බිල්පත් ක්‍රියාකාරකම් නිවැරදි ව සපුරාලීමට වෙළෙන්දන්ට තිබූ කැමැත්ත නිසා ආරම්භ විය. බිල්පතක ණයක් ආපසු අය කර ගැනීම සඳහා ඉක්මන් සහ දැඩි නීතිරීති තීරණය කිරීමට අවශ්‍ය විය. ඒ සඳහා විශේෂ වෙළෙඳපොළ අධිකරණ පිහිටුවීය. ගෙවීම් පැහැර හැරි අවස්ථාවල දී අධිකරණ තීරණ මත ණයකරුවෝ රඳවා තබා ගත්හ. ණය හිමියන්ට ගෙවීම සඳහා ඔවුන්ගේ දේපළ රාජසන්තක කළේ ය. සමහර වෙළෙඳපොළ මෙ වැනි ක්‍රම අනුගමනය කරන ලද්දේ ණයකරුවන්ට දඬුවම් කිරීම සඳහා ය. ඔවුනට වෙළෙඳපොළ ක්‍රියාකාරකම්වලට සහභාගී වීම තහනම් විය. බිල්පත් සංසරණය සඳහා දැඩි නීතිරීති ඉතාලි රජය විසින් ක්‍රියාවට නංවන ලදී.

**පිටසන**

මුදල් රහිත ගෙවීමේ මාධ්‍යයක් මෙන් ම මුදල් යැවීමේ ආරක්ෂිත මාර්ගයක් ලෙස විනිමය බිල්පත් වර්ධනය වන විට සහ ණය දීමේ මූලාශ්‍ර අලුතින් බිහි වන විට ගැටලුවක් ඇති විය. එම ගැටලුව වූයේ එක් පුද්ගලයකුගෙන් තවත් අයකුට කාසි හෝ ටංකනය නො කළ වටිනා ලෝහ හුවමාරු කළ

හැකි වුව ද විනිමය බිල්පත් කොයි ලෙසකටවත් හුවමාරු කළ නො හැකි වීමයි. මධ්‍යකාලීන යුගය අවසානයේ දී විනිමය බිල්පත් එහි සඳහන් කොට ඇති ඉදිරිපත් කරන්නාට පමණක් සීමා වුනි. ඔහු පමණක් මෙම බිල්පත් මුදල් බවට පත් කර ගත්තේය. හුවමාරු පද්ධතියට සම්බන්ධ නැති කිසි ම අයකුට බිල්පතක් පැවරිය නො හැකි විය. කිසි ම වර්ගයකට අයත් ණය උපකරණයක් පවරා දීමට රෝමානු, ජර්මානු, ඉස්ලාමීය නීතිවලින් අවසර නො ලැබිණි. මෙම ප්‍රශ්නයට මුලින් ම පිළිතුරු ලබා ගත්තේ වෙළෙඳුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ගැවසෙන විශාල ජාත්‍යන්තර වෙළෙඳපොළවලිනි. ඔවුහු වසරේ එක් නිශ්චිත කාලයක දී එක් ස්ථානයකට රොක් වූහ. ඒ ජාත්‍යන්තර ගෙවීම් පියවීම සඳහා ය. ප්‍රංශයේ ෂැම්පේන් සහ ලියෝන් වෙළෙඳපොළවල දී ද පසු ව ස්විට්සර්ලන්තයේ ජිනීවා වෙළෙඳපොළේ දී ද, අවසානයේ දී ඉතාලියේ ජිනෝවා බැංකුකරුවන් විසින් ප්‍රංශයේ බයිසන්සෝන් (Bisenzone) නගරය මුල් කරගෙන පැවැත් වූ වෙළෙඳපොළේ දී ද ජාත්‍යන්තර ගෙවීම් ප්‍රධාන වශයෙන් පියවන ලදී. විනිමය බිල්පතක ණයහිමියා එම මොහොතෙහි ම තවත් බිල්පතක ණය ගැතියා විය. සහභාගි වන වෙළෙන්දන් ගේ ගිණුම් පොත්වලින් ණයහිමියා සහ ණයගැතියා යන දෙදෙනා ම තමන් ගේ ණය කපා හැරිය හ. එ නම් සියළු ම හිමිකම් සහ ණය පියවනු ලැබී ය. එම අවස්ථාවේ දී පියවිය නො හැකි මුදලක් වුව හොත් ඊ ළඟ වෙළෙඳපොළේ දී පියවීම සඳහා අලුතින් විනිමය බිල්පතක් නිකුත් කෙරිනි. වෙළෙඳපොළ අධිකරණය මගින් බිල්පත් ගෙවීම පිළිබඳ සුරක්ෂිතතාව තහවුරු කළේ ය.

විනිමය බිල්පත් එකිනෙකා අතර හුවමාරු කර ගැනීම සඳහා පිටසන භාවිතා කරයි. පිටසන යනු බිල්පතක පිටපැත්තෙහි ලියන ලද සටහනකි. එය හුවමාරු ක්‍රියාවලියට සම්බන්ධයක් නො මැති පුද්ගලයකුට බිල්පත ඉදිරිපත් කිරීම සඳහා බලය පවරයි. පිටසනෙහි ආධාරයෙන් විනිමය බිල්පතෙහි ඇතුළත් හිමිකම තවත් පුද්ගලයකුට පවරනු ලබයි. එය තීරණය කරනු ලබන්නේ බිල්පතෙහි පිටපැත්තේ ඇති අත්සන මගිනි. පිටසන නිසා විනිමය බිල්පත වෙළෙන්දන් අතර ගනුදෙනු කළ හැකි ලියවිල්ලක් බවට පත් විය.

පිටසනේ ආරම්භය ද ඉතාලිය බව ඇතැමෙකුගේ මතයයි. එහෙත් එය 1620 දී පමණ ප්‍රංශයේ දී පටන් ගැනුණු බවට ද මතයක් වෙයි. එ සේ වුව ද බිල්පත් පැවරීම සම්බන්ධයෙන් ඊටත් පැරැණි වාර්තා පිළිබඳ ව ද සටහන් දැකිය හැක. පුරාණ ප්‍රංශ ලියවිලිවලට බොහෝ කලකට පෙර 1389 දී එංගලන්තයේ තිබූ බිල්පත්වල පිටපැත්තෙහි පැවරීමේ සටහන් දැකිය හැකි විය. පිටසන් කිරීමේ ප්‍රථම සාක්ෂි ලෙස ඒවා ද සළකනු ලබයි. මේ නිසා පිටසනේ ආරම්භය පිළිබඳ ව මතභේද පවතී.


1654 දී නිකුත් කළ රාජ නියෝගයකින් සහ 1673 නිකුත් වූ ආඥාපනතින් ප්‍රංශයේ පිටසන නීත්‍යානුකූල ව පිළිගනු ලැබී ය. 1673 දී, එය ආරක්ෂාව සඳහා බිල්පත්‍රයෙහි පිටපැත්තෙහි යෙදූ අත්සනක් පමණක් විය. පිටසන්කරුගේ අත්සන සමග දිනය, පැවරුම්ලාභියා ගේ නම සහ ගෙවනු ලබන මුදල් ප්‍රමාණය සඳහන් වූයේ නො මැති නම් පිටසන වලංගු නො වන බවට පසු ව නීති සම්පාදනය කරන ලදී. 17 වන ශත වර්ෂය ආරම්භයේ දී ප්‍රංශයේ පිටසන බොහෝ විට දැකිය හැකි විය. ප්‍රංශයේ පිටසන ව්‍යාප්තිය කෙරෙහි ප්‍රංශ නීතියේ ඇති වූ වෙනස්කම් ද ඉවහල් වුනි.

මූල්‍ය වෙළෙඳපොළ හා සම්බන්ධ වීමේ දී පිටසන් කිරීමට විශාල ආර්ථික වැදගත්කමක් හිමි විය. විනිමය බිල්පත් වැනි ගිවිසුමක් යටතේ සිදු වන වෙළෙඳාම් ඉතාලියේ විශාල ලෙස ව්‍යාප්ත නො වුනි. ඒවා වයඹදිග යුරෝපයේ ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානවල ව්‍යාප්ත විය. 16 වන ශත වර්ෂයේ අග භාගයේ දී වාණිජ බැංකුකරුවන්ට ඔවුන් ගේ පිටසන සහිත බිල්පත් භාවිතය තව තවත් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය විය. ඒ 1531 දී විවෘත කරන ලද කොටස් වෙළෙඳපොළේ දී නැවත අලෙවි කිරීම පිණිස පිටසන් කළ විනිමය බිල්පත් මිල දී ගැනීමට අවකාශ ලබා ගැනීමට ය.



ෂැම්පේන් වෙළෙඳපොළ

ඉතාලියේ පිටසන් කිරීම බොහෝ දුරට සීමා සහිත ලෙස සිදු විය. එයට හේතුව වූයේ මුදල් රහිත ව ගෙවීම් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙළ කිරීමේ වගකීමෙන් මුදල් මාරුකරන්නන් ඉවත් වීමයි. පිටසන් කිරීම හේතුවෙන් අලුතින් බිල්පත් නිකුත් කිරීම අඩු වූ බැවින් ජාත්‍යන්තර වෙළෙඳාම් සහ විනිමය වෙළෙඳපොළවල දී ගෙවිය යුතු විනිමය බිල්පත් ප්‍රමාණය පහළ යෑම ද මේ නිසා සිදු විය. මේ අතර වෙළෙඳපොළේ විනිමය බිල්පත් සමග කරනු ලබන වෙළෙඳ කටයුතුවල දී වෙළෙඳපොළ බැංකුකරුවන් ගේ ඒකාධිකාරය බිඳී යෑමේ හැකියාවක් ද පිටසන් කිරීම නිසා ඇති විය. එ බැවින්, පිටසන් කිරීම හෝ නැවත නැවතත් පිටසන් කිරීම විරුද්ධ ව ඔවුහු නැගී සිටියහ. පිටසන හඳුන්වා දීමට පෙර ඔවුනට බිල්පත් ඉදිරිපත් කළ හැකි වූයේ මුදල් තැන්පතුවක් පිළිගැනුමක දී සහ ගෙවීමක් පියවීමේ දී පමණි.




මෙම තත්ත්වය නිසා ප්‍රතිඵල දෙකක් ඇති විය. මුල් ප්‍රතිඵලය වූයේ වෙළෙඳපොළෙහි වැදගත්කම සැළකිය යුතු ලෙස පහළ වැටීමයි. විනිමය බිල්පත් මුදල් බවට හරවා ගැනීමට සහ ගිණුම් පියවීමට වෙළෙඳපොළ බැංකුකරුවන් වෙත යෑමට වෙළෙන්දන්ට අවශ්‍ය නො වී ය. විනිමය වෙළෙඳපොළ බිඳ වැටීම මෙන් ම ඒවායේ ක්‍රියාකාරිත්වයට සහ වෙළෙඳපොළ බැංකුකරුවන්ට සිදු වූ හානිය වෙනස් කළ නො හැකි විය. ඔවුන් ගේ ක්‍රියාකාරකම් සියල්ල ම පිටසන් කරනු ලබන වෙළෙන්දන් අතට පත් වුනි. සංසරණය සඳහා වැඩි ඉඩකඩක් බිල්පතින් සැලසුණු හෙයින් ගෙවීම් තුලනය කිරීම සඳහා එම වෙළෙන්දන් විසින් නිකුත් කරනු ලැබූ විනිමය බිල්පත් ප්‍රමාණය ඉහළ ගියේ ය.

පිටසනේ හුවමාරු සටහන් කිහිපයක් දක්නට ලැබීම ද එක් විශේෂත්වයක් විය. කිසියම් බිල්පතකට අත්සන් තැබූ සියළු දෙනාට ම එම බිල්පත සඳහා ඇති වගකීම එක හා සමාන විය. එම නිසා එම බිල්පතේ විශ්වසනීයත්වය සැළකිය යුතු ලෙස ඉහළ ගියේ ය.

### අර්ථදැක්වීම

මෙ ලෙසින් ඉතිහාසය මුළුල්ලේ වර්ධනය වූ "ගනුදෙනු කළ හැකි ලියවිලි" භාවිතය ක්‍රමයෙන් අංගසම්පූර්ණ මූල්‍ය උපකරණයක් බවට පරිණාමය විය. වර්තමානයේ දී මේවා පොදුවේ විනිමය බිල්පත් ලෙසින් හැඳින් වේ. මෙම පසුබිම මත සිට මෙ කී මූල්‍ය උපකරණය පිළිබඳ පැහැදිළි අර්ථ දැක්වීමක් ඉදිරිපත් කළ හැකි ය.

විනිමය බිල්පතක් යනු පොලී ගෙවීමක් සිදු නො වන එක්තරා වර්ගයක චෙක්පතකි. එ සේ නො වේ නම් පොරොන්දු නෝට්ටුවකි. අනාගතයේ නිශ්චිත දිනයක දී නිශ්චිත මුදල් ප්‍රමාණයක් එක් පුද්ගලයකු විසින් තවත් පුද්ගලයකුට ගෙවීම සඳහා ලිඛිත ව කරනු ලබන නියෝගයකි. එය බොහෝ විට භාවිතා කරනු ලබන්නේ ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ය. බැංකුවකින් නිකුත් කරනු ලබන විනිමය බිල්පතක් බැංකු අණකරයක් ලෙසින් හැඳින්වේ. වෙනත් පාර්ශ්වයක් මගින් නිකුත් කරයි නම් එය වෙළෙඳ අණකරයක් වේ. ඇතැම් විටෙක මේවා හුදෙක් ම අණකර ලෙසින් පමණක් ම හැඳින් වේ. අණකරයක් ලෙස හැඳින්වූව ද පිටසන් කිරීමෙන් අන් අයකුට පැවරිය හැක.

මුදල් පිළිබඳ වූ සෑම ලියවිල්ලක් මෙන් ම විනිමය බිල්පතක් ද ප්‍රතිග්‍රහණයට පෙර එහි සත්‍යතාව තහවුරු කර ගත යුතු ය. ඒ සඳහා අණකරු හෝ එය නිකුත් කළ තැනැත්තා හෝ පිළිබඳ ව සොයා බැලිය යුතු ය. අණකරු බැංකුවක් නම් බැංකුව අමතා බිල්පතේ නිරවද්‍යතාව සහ බැංකුවේ ණය යෝග්‍යතාව පිළිබඳ ව විමසිය හැක. පුද්ගලික ව නිකුත් කළ බිල්පතක් නම් එය නිකුත් කළ පුද්ගලයා ගේ ණය යෝග්‍යතාව මත බිල්පතේ අවදානම රඳා පවතී.❂


රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.